**සැලකිය යුතුයි!**

ඔබ විසින් සෙලාන් Visa/Master කාඩ්පත භාවිත කිරීමට පෙරාතුව, කරුණාකර ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුම කියවන්න. මෙම නීතිරීති සහ කොන්දේසි වල ඇතුළත් වන යෙදුම (කාඩ්පත), පහත සඳහන් ඕනෑම සෙලාන් ක්‍රෙඩිට් කාඩ්පතක් හෝ ඒවායෙහි යම් එකතුවක් සම්බන්ධයෙන් අදාළ වන්නේය:

- සෙලාන් Visa Gold/Platinum/Signature/Corporate/Infinite
- සෙලාන් Master Titanium/World

මෙම කාඩ්පත් භාවිත කිරීම මගින් පහත සඳහන් නීතිරීති සහ කොන්දේසි ඔබ විසින් පිළිගනු ලබන අතර, ඒවා මගින් බැඳී සිටීම ද සිදුවන්නේය.

පහත සඳහන් නීතිරීති සහ කොන්දේසි මත, සෙලාන් බැන්ක් පීඑල්සී (බැංකුව) විසින් සෙලාන් Visa/Master කාඩ්පත් (කාඩ්පත) නිකුත් කරනු ලබයි.

## ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම

සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කිරීම සම්බන්ධයෙන් මම/අප මෙමගින් අයදුම් කර සිටින අතර, මෙම අයදුම්පත සහ මෙහි ඇමුණුම් (තිබේ නම්) මගින් ලබා දී ඇති තොරතුරු, සියලු කරුණු සම්බන්ධයෙන් සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර, මම/අප සඳහා ගිණුමක් විවෘත කරන ලෙසට සහ, කාඩ්පත (කාඩ්පත්) කැබලි දෙකකට කපා එම කැබලි දෙකම ඔබ වෙත ආපසු ලබාදෙමින් කාඩ්පත (කාඩ්පත්) භාවිතය සම්බන්ධයෙන් මාගේ/අපගේ අයිතීන් අත්හරින තෙක්, කාඩ්පත (කාඩ්පත්) අලුත් කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කරන මෙන් මම/අප ඉල්ලා සිටිමි / සිටිමු.

මා/අප වෙත දැනුම්දීමකින් තොරව මාගේ/අපගේ බැංකුකරුවන් වෙතින් හෝ සුදුසු යැයි සලකනු ලබන වෙනත් ඕනෑම මාර්ගයකින් හෝ කවර ආකාරයේ වුවද ඕනෑම තොරතුරක් කලින් කලට තහවුරු කරගැනීමට සෙලාන් බැන්ක් පීඑල්සී වෙත මම/අප විසින් මෙමගින් බලය ලබා දෙමි/දෙමු.

සෙලාන් බැන්ක් පීඑල්සී විසින් නිකුත් කරන ලද මෙකී සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි නීතිරීති සහ කොන්දේසි වලට යටත්ව පමණක් මාගේ/අපගේ ක්‍රෙඩිට් කාඩ්පත (කාඩ්පත්) භාවිත කළ හැකි බවට මම/අප එකඟ වන අතර, මෙම ක්‍රෙඩිට් කාඩ්පත සමග මා/අප වෙත නිකුත් කරන ලද මෙකී සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි අඩංගු නීතිරීති සහ කොන්දේසි මම/අප විසින් නිසි ලෙස කියවා තේරුම් ගත් බවටත්, එකී නීතිරීති සහ කොන්දේසි වලින් බැඳී සිටීමටත් මම/අප වැඩිදුරටත් එකඟ වෙමි/වෙමු.

විදේශයන් හි දී වාණිජමය ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රාග්ධනය පැවරීම සඳහා ක්‍රෙඩිට් කාඩ්පත භාවිත නොකිරීමට මම/අප එකඟ වෙමි/වෙමු.

මම/අප විදේශයකට සංක්‍රමණය වන අවස්ථාවක දී හෝ විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන අවස්ථාවක දී හෝ බැංකුව වෙත කාඩ්පත (කාඩ්පත්) භාරදීමට සහ සියලු ගෙවීම් සම්පූර්ණයෙන්ම පියවීමට මම/අප එකඟ වෙමි / වෙමු.

මාගේ/අපගේ (මෙහි මින් මතුවට "කාඩ්පත් හිමියා" ලෙස දැක්වේ) ඉල්ලීම මත සහ ඉල්ලා සිටි විටෙක සියලු ගෙවීම් පියවීමට වූ පොරොන්දුව සහ භාරගැනීම මත නිකුත් කරන ලද මූලික සහ අතිරේක /පරිපූරක කාඩ්පත (කාඩ්පත්) වෙත වන සියලු අය කිරීම් සම්බන්ධයෙන් එක් ව හා වෙන් වෙන් ව වගකීමට බැඳී සිටීමට මම/අප එකඟ වෙමි / වෙමු.

1988 අංක 30 දරන ශ්‍රී ලංකා බැංකු පනතෙහි අඩංගු මාර්ගෝපදේශ හා විධාන වලට සහ එකී 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධාන වල විධිවිධානයන් ඇතුළුව එකී පනතෙහි අත්හැර දැමූ දේපළ සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සහ විධානයන්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතෙහි (PMLA), 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි (FTRA), විධිවිධාන වලට සම්බන්ධිත බව පිළිබඳව මම/අප දැනුවත් බැවි මම/අප තහවුරු කරමි/කරමු. ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක මෙහෙයුම් කටයුතු වලට අදාළව, ඉහතින් දක්වා ඇති සියලුම නීති, විධානයන් සහ මාර්ගෝපදේශ වලට අනුව අවශ්‍ය කෙරෙන එවැනි විධිවිධාන වලට සෑම අවස්ථාවක දී ම බැංකුව අනුකූල වනු ඇති බව අවබෝධ කරගෙන, තේරුම් ගෙන, ඊට එකඟ වන බවට මම/අප තහවුරු කරමි/කරමු. කාඩ්පත් හිමියා විසින් කිසිදු අවස්ථාවක දී, කාඩ්පත මත වන ගෙවීමට නියමිත හිඟ ශේෂයට අමතරව, එවැනි ආකාරයේ මුදල් ප්‍රමාණයන් කාඩ්පත් ගිණුමට පූර්ව-වශයෙන් එක් කිරීම සිදු නොකළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක මෙහෙයුම් කටයුතු වලට අදාළව, ඉහත සඳහන් සියලුම නීති, විධානයන් සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි එවැනි විධිවිධාන වලට සෑම අවස්ථාවක දී ම බැංකුව අනුකූල වනු ඇති බව අවබෝධ කරගෙන, තේරුම් ගෙන, ඊට එකඟ වන බවට කාඩ්පත් හිමියා තහවුරු කරයි.

කිසිදු හේතු දැක්වීමකින් තොරව, සිය පරම අභිමතය පරිදි මෙම අයදුම්පත පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සෙලාන් බැන්ක් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" ලෙස දැක්වේ) වෙත අයිතිය පවතින බවට මම/අප පිළිගන්නා අතර, මෙහි පහතින් දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි වලින් බැඳී සිටීමට අවලංගු කළ නොහැකි ආකාරයෙන් එකඟව, පොරොන්දු වෙමි/වෙමු.

**අර්ථනිරූපණ**

මෙම නීතිරීති හා කොන්දේසි වල ලොකු අකුරෙන් දක්වා ඇති යෙදුම් සඳහා, සන්දර්භය විසින් වෙනත් ආකාරයකින් අවශ්‍ය නොකෙරෙන්නේ නම්, පහත දැක්වෙන අර්ථ පවතිනු ඇත: "ගිවිසුම" යන්නෙන් අදහස් වන්නේ, මෙම ගිවිසුමෙහි කොටසක් බවට පත්වනු ඇති, සහ කලින් කලට පළ කෙරෙන සේවාවන් සැපයීම සඳහා වන යම් අතිරේක නීතිරීති සහ කොන්දේසි ද ඇතුළත්ව, කලින් කලට මෙම ගිවිසුමේ නීතිරීති වලට අනුකූලව සංශෝධනය කෙරෙන මෙම නීතිරීති ය.

**අර්ථදැක්වීම**

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම්, හෝ විශේෂිතවම වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් මිස:

(a) පහසුව සඳහා පමණක්, ශීර්ෂ පාඨයන් ඇතුළත් කර ඇති අතර, කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුමේ ව්‍යුහයට ඉන් බලපෑමක් නොවන්නේ ය;

(b) "ඇතුළත්ව" යන වචනය සහ ඊට සමාන වචන වලින් කිසිදු සීමා කිරීමක් අදහස් නොවේ;

(c) කාඩ්පත් හිමියා යන යෙදුමෙන් යම් අතිරේක කාඩ්පත් හිමියන් අදහස් වීම සහ ඇතුළත් වීම සිදුවේ;

(d) කාඩ්පත යන යෙදුමෙන් සෙලාන් බැන්ක් පීඑල්සී විසින් නිකුත් කළ ඕනෑම වර්ගයක කාඩ්පතක් / කාඩ්පත් (සෙලාන් Platinum Visa/ Freedom MasterCard/ Gold Visa/ සෙලාන් Classic Visa කාඩ්පත) අදහස් වීම සහ ඇතුළත් වීම සිදුවන අතර, නිකුත් කර ඇති ඕනෑම අතිරේක/පරිපූරක කාඩ්පතක්/කාඩ්පත් ද ඊට ඇතුළත් වේ;

(e) එක් පුද්ගලයකුට වැඩි සංඛ්‍යාවකින් යම් පාර්ශ්වයක් සමන්විත වේ නම්, ඒ එක් එක් පුද්ගලයාගේ වගකීම හවුල් සහ වෙන් වෙන් වශයෙන් ද වේ;

(f) ඒකවචනය පමණක් හැඟවෙන වචන වලින් බහුවචනය ද බහුවචනය පමණක් හැඟවෙන වචන වලින් ඒකවචන ද, පුරුෂලිංග හැඟවෙන වචන වලින් ස්ත්‍රීලිංග වචන ද ස්ත්‍රීලිංග වචන වලින් පුරුෂලිංග වචන ද ඇතුළත් වන්නේ ය;

(g) මෙම ගිවිසුමේ අර්ථනිරූපණයක් සහිත එක හා සමාන වචන හෝ පද සඳහා එම අර්ථනිරූපණයට අදාළ අර්ථයන් ඇත;

(h) මෙම ගිවිසුමේ වගන්ති හෝ වෙනත් හැඳින්වීම් පිළිබඳව සඳහන් කිරීමේ දී; කාඩ්පත සක්‍රීය කරන අවස්ථාවේ දී, ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන මෙම කාඩ්පත් ගිවිසුමේ සඳහන් සහ අන්තර්ගත සියලු නීතිරීති සහ කොන්දේසි සඳහා කාඩ්පත් හිමියා මෙයින් එකඟ වන බවට සලකනු ලබන බවට පාර්ශ්ව දෙක විසින් ම සහ පාර්ශ්ව දෙක අතර මෙයින් ගිවිසා ගනු ලැබේ;

(i) "මුදල්" යන්නෙන් අදහස් වන්නේ, ශ්‍රී ලංකා රජය විසින් හෝ විදේශීය රජයක් විසින් හෝ නිකුත් කළ, ස්ථාපිත කළ, බලය දුන් හෝ සම්මත කළ මුදල් ඒකකයක් හෝ හුවමාරු මාධ්‍යයක් හෝ වේ;

(j) "මුදල් වටිනාකම" යන්නෙන් අදහස් වන්නේ, ගබඩා කළ වටිනාකම, ගෙවීම් පිළිබඳ නීත්‍යානුකූල ලේඛනය හෝ ගිණුම වෙත බැර කිරීම ආදී ඕනෑම ආකාරයක් ද ඇතුළුව මුදලින් පිරිමුදවිය හැකි හෝ නොහැකි හුවමාරු මාධ්‍යයක් වන අතර, ඊට රන් කාසි සහ ඝන රන් ද ඇතුළත් විය හැකි වේ;

(k) "ගතික මුදල් පරිවර්තනය" ("Dynamic Currency Conversion") යන්නෙන් අදහස් වන්නේ, භාණ්ඩ හෝ සේවාවන් මිලට ගැනීමේ මිල, මිලට ගැනීමේ මිල ප්‍රදර්ශනය කෙරුණු ව්‍යවහාර මුදල් වර්ගය වෙතින් කාඩ්පත් හිමියාගේ බිල්ගත කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය වෙතට පරිවර්තනය කිරීමයි. එවිට, වෙළෙඳ මහතාගේ රටෙහි ව්‍යවහාර මුදල් වර්ගය කුමක් වුවද, එකී ව්‍යවහාර මුදල් වර්ගය, ගනුදෙනු ව්‍යවහාර මුදල් වර්ගය බවට පත් වේ;

(l) "බහුවිධ-ව්‍යවහාර මුදල් ගනුදෙනු - ශ්‍රීලංරු" යන්නෙන් අදහස් වන්නේ, දේශීය වශයෙන් ශ්‍රීලංරු වලින් වෙළෙඳ ආයතන/වෙබ් අඩවි වෙතින් සිදු කළ ගනුදෙනු වුවත් වෙළෙඳ මහතාගේ ලැබුම්කාර බැංකුව (ක්‍රෙඩිට් කාඩ්පත් වලින් කළ ගෙවීම් පිළිබඳ සැකසුම් කටයුතු, වෙළෙඳ මහතා වෙනුවෙන් සිදු කරන බැංකුව) දේශීය වශයෙන් ලියාපදිංචි නොවූ බැංකුවකි. එවිට, බැංකුව වෙතින් බැංකුව වෙත පියවීම සිදු කෙරෙන්නේ විදේශ ව්‍යවහාර මුදලිනි;

(m) "පවුලේ ළඟම සාමාජිකයන්" යන්නෙන් අදහස් වන්නේ, මූලික කාඩ්පත් හිමියාගේ කලත්‍රයා, දෙමාපියන්, විවාහක හෝ අවිවාහක දරුවන්, සොහොයුරන්, සොහොයුරියන් වේ;

(n) "BFCA" (Business Foreign Currency Account) යන්නෙන් අදහස් වන්නේ, විදේශ ව්‍යවහාර මුදලින් වන ව්‍යාපාරික ගිණුමකි;

(o) "PFCA" (Personal Foreign Currency Account) යන්නෙන් අදහස් වන්නේ, විදේශ ව්‍යවහාර මුදලින් වන පුද්ගලික ගිණුමකි;

(p) "DFCA" (Diplomatic Foreign Currency Account) යන්නෙන් අදහස් වන්නේ, විදේශ ව්‍යවහාර මුදලින් වන රාජ්‍ය තාන්ත්‍රික ගිණුමකි;

(q) "DRA" (Diplomatic Rupee Account) යන්නෙන් අදහස් වන්නේ, රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමකි;

(r) "IIA" (Inward Investment Account) යන්නෙන් අදහස් වන්නේ, අන්තර්නම්‍ය ආයෝජන ගිණුමකි;

(s) "ERIA" (Emigrant Remittance Income Account) යන්නෙන් අදහස් වන්නේ, විගාමික ප්‍රේෂණ ආදායම් ගිණුමකි.

## 1. කාඩ්පත

1.1 කාඩ්පත බැංකුවේ දේපළක් වන අතර, බැංකුව විසින් ඉල්ලා සිටි විටෙක කාඩ්පත් හිමියා විසින් එය වහාම බැංකුව වෙත භාර දෙනු ඇත.

1.2 කිසිදු පූර්ව දැනුම්දීමකින් හෝ හේතු දැක්වීමකින් හෝ තොරව සිය පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී කාඩ්පත සහ කාඩ්පත් හිමියාගේ අයිතිය ආපසු ගැනීම බැංකුව විසින් සිදු කළ හැකි අතර, ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් සඳහා බලය ලබා දෙන ලෙසට සිදු කරන ඕනෑම ඉල්ලීමක් බැංකුවට ප්‍රතික්ෂේප කළ හැකිය.

## 2. කාඩ්පත භාරදීම සහ භාවිතය

2.1 කාඩ්පත ලැබුණු වහාම කාඩ්පත් හිමියා විසින් කාඩ්පතේ පිටුපසෙහි තම අත්සන තැබිය යුතු අතර, කාඩ්පත භාවිත කිරීම සඳහා වෙනත් කිසිදු තැනැත්තකුට අවසර ලබා නොදිය යුතු මෙන්ම සෑම කල්හි ම කාඩ්පත සුරැකිව/ ආරක්ෂිතව කාඩ්පත් හිමියාගේ පුද්ගලික පාලනය යටතේ තබාගත යුතුය.

2.2 කාඩ්පතෙහි පුද්ගල හඳුනාගැනීමේ අංකය (“PIN”) සාමාන්‍ය තැපෑලෙන් කාඩ්පත් හිමියා වෙත යවනු ලැබේ. එම PIN අංකය තැපැල් කරනු ලැබීමෙන් පසුව පැය හැත්තෑ දෙකක කාලයක් ඇතුළත එය කාඩ්පත් හිමියාට ලැබී, භාර ගෙන ඇති බවට සලකනු ලැබේ. PIN අංකය ලැබුණු පසුව, එය කාඩ්පත් හිමියාගේ දේපළක් වන අතර, PIN අංකය ආරක්ෂිතව ඇති බවට සහ කිසිම ආකාරයකින් හෝ ක්‍රමයකින් එය සම්මුතියකට ලක් නොකරන බවට සහතිකවීම සඳහා කාඩ්පත් හිමියා විසින් සෑම පූර්වෝපායයක්ම ගනු ලැබිය යුතුය.

2.3 කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන්) වෙත සියලු කාඩ්පත් කුරියර් සේවය මගින් යවනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියාට සහ අතිරේක කාඩ්පත් හිමියාට කාඩ්පත/කාඩ්පත් ලැබෙන අවස්ථාවේ දී, ඔහුගේ/ඇයගේ අනන්‍යතාව සහ කාඩ්පත පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. කාඩ්පත් හිමියා විසින් ස්වකීය අභිමතය පරිදි ඔහු/ඇය වෙනුවෙන් කාඩ්පත/කාඩ්පත් භාරගැනීමට හෝ ලබාගැනීමට හෝ යම් තුන්වන පාර්ශ්වයකට ලිඛිතව බලය දිය හැකි අතර, කාඩ්පත් හිමියා හෝ ඔහු/ඇය විසින් තමා වෙනුවෙන් බලය පැවරූ තැනැත්තා විසින් කාඩ්පත භාරගන්නා අවස්ථාවේ සිට කාඩ්පත සම්බන්ධයෙන් උපචිත වන සියලු ගාස්තු සඳහා වගකිව යුතුය. බැංකුවේ/එහි නියෝජිතයාගේ අදහස අනුව කාඩ්පත් හිමියාගේ නියෝජිතයා බවට පෙනී යන යම් තුන්වන පාර්ශ්වයකට බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි කාඩ්පත භාරදීම සහ ලබාදීම කරනු ලැබිය හැකිය.

2.4 කාඩ්පත් හිමියා සම්බන්ධයෙන් දී ඇති ලිපිනය ඔහුගේ ඉල්ලීම මත වෙනස් කරන ලද අවස්ථාවක දී, බැංකුව විසින් කාඩ්පත, ප්‍රකාශන, PIN සහ/හෝ කාඩ්පත භාරදීම සම්බන්ධයෙන් වන වෙනත් යම් ලිපි ලේඛන භාරදීමේ ලිපිනය වශයෙන් එම අලුත් ලිපිනය භාවිත කරනු ඇත.

2.5 කාඩ්පත හෝ කාඩ්පත සහ PIN අංකය යන දෙක ම භාවිතයෙන් කරනු ලබන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියා වංචා සහගත ලෙස ක්‍රියා කිරීම හෝ කාඩ්පත හෝ PIN අංකය ආරක්ෂා නොකරමින් නොසැලකිල්ලෙන් ක්‍රියා කිරීම සහ කාඩ්පත හෝ PIN අංකය නැතිවීම, සොරකම් කිරීම හෝ හෙළිදරවු වීම පිළිබඳව වහාම බැංකුවට දැනුම් නොදීම හේතුවෙන් කාඩ්පතට සිදුවන හරවීම් හේතුවෙන් සිදුවන සියලු මුදල් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සීමාවකින් තොරව, සම්පූර්ණයෙන් වගකීමට බැඳී සිටිය යුතුය. කලින් කලට බැංකුව විසින් කරනු ලබන යම් සන්නිවේදන මගින් බැංකුව විසින් නිර්දේශ කරනු ලබන ආකාරයට කාඩ්පත හෝ PIN අංකය ආරක්ෂා කිරීම සහ/හෝ සුරැකීම සඳහා වූ පියවර අනුගමනය කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත් වීම ඉහත කී කාර්යය සඳහා කාඩ්පත් හිමියාගේ පාර්ශ්වයෙන් සිදුවන බරපතල අතපසු කිරීමක් ලෙස සලකනු ලැබේ.

2.6 කාඩ්පත භාවිත කිරීම හේතුවෙන් උපචිත වන ("කාඩ්පත් ගනුදෙනු") භාණ්ඩ, සේවා පිළිබඳව සියලු මිල දී ගැනීම් වල වටිනාකම් සහ සියලු මුදල් අත්තිකාරම් මෙන්ම වෙනත් සියලු ගාස්තු සහ අය කිරීම් බැර කරනු ලැබිය යුතු වූ කාඩ්පත සම්බන්ධ (මෙහි මින් මතු ඇතැම් අවස්ථාවල දී "කාඩ්පත් ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිණුමක් බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබේ. යම් විකිණීමක් හෝ මුදල් අත්තිකාරමක් පිළිබඳ යම් වවුචර්පතක අත්සන් තැබීමට කාඩ්පත් හිමියා අපොහොසත්වීම මගින්, ඒ සම්බන්ධයෙන් බැංකුව වෙත කාඩ්පත් හිමියා හට පවතින බැඳීමෙන් කාඩ්පත් හිමියා මුදාහැරීමක් සිදු නොවේ.

2.7 ATM ගනුදෙනු සම්බන්ධයෙන් වනවිට, බැංකුවෙහි පරිගණක පද්ධතියේ පවතින තොරතුරු සහ/හෝ වාර්තා, කාඩ්පත් හිමියා විසින් එම ගනුදෙනුව සඳහා නිසි අවසරය ලබා දී ඇති බවට තීරණාත්මක සාක්ෂියක් වේ.

2.8 ගනුදෙනුවක් අතරවාරයෙහි PIN අංකය සබල කරන ලද ගනුදෙනුවක් (උදා: ස්වයංක්‍රීය ගනුදෙනු වලදී ටෙලර් යන්ත්‍රය / දුරකථන බැංකුකරණය /අන්තර්ජාල බැංකුකරණය භාවිත කරන ගනුදෙනුවක දී PIN අංකය සබල කර) සිදු කරන අවස්ථාවක දී, බැංකුවෙහි පරිගණක පද්ධතියේ පවතින තොරතුරු සහ/හෝ වාර්තා, කාඩ්පත් හිමියා විසින් එම ගනුදෙනුව සඳහා අවසර ලබා දී ඇති බවට තීරණාත්මක සාක්ෂියක් වන බවට කාඩ්පත් හිමියා මෙමගින් තේරුම් ගෙන එකඟ වේ.

2.9 කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම පිළිබඳව පූර්ව දැනුම්දීමක් බැංකුව වෙත ලබා දීමට පෙර, කාඩ්පත් හිමියා හෝ වෙනත් යම් තුන්වන පාර්ශ්වයක් හෝ විසින් සිදු කර ඇති ගනුදෙනුවක් බවට විශ්වාස කිරීමට බැංකුව වෙත හේතු ඇති අවස්ථාවක දී, යම් හබකර සිටින ගනුදෙනුවක් (ගනුදෙනු) සම්බන්ධයෙන් වූ වටිනාකම කාඩ්පත් හිමියාගෙන් අයකර ගැනීමේ අයිතිය බැංකුව විසින් රඳවා ගනු ලැබේ.

2.10 ඕනෑම යම් දිනයක කාඩ්පත් ගිණුම ගෙවීමට නියමිතව හිඟව ඇත්නම් හෝ ඕනෑම යම් ගනුදෙනුවක් (ගනුදෙනු) සැක කටයුතු බවට අනාවරණය වුවහොත් හෝ යම් හෝ සියලුම කාඩ්පත් ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනියි.

2.11 කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුම අවසන් කළ ද සහ/හෝ කාඩ්පත භාර දෙනු ලැබුව ද එය නොතකා, කාඩ්පත සම්බන්ධයෙන් බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන සියලු ණය පහසුකම් සහ ඒ යටතේ වූ සියලු සම්බන්ධිත ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය.

2.12 කාඩ්පත් හිමියා විසින් දැඩි ලෙස අනුගමනය කරනු ලැබිය යුතු සහ කාඩ්පත භාවිතයේ දී බැඳී සිටීමට යටත් වන, ණය සීමාවක් කාඩ්පත් ගිණුම සඳහා බැංකුව විසින් කාඩ්පත් හිමියාට පවරා දෙනු ඇත. කාඩ්පත් හිමියාට වෙත පූර්ව දැනුම්දීමක් සමග, පවත්නා කාඩ්පත සම්බන්ධයෙන් එහි ණය සීමාව ඉහළ දැමීම හෝ ශ්‍රේණිය ඉහළ දැමීම (හෝ පහළ දැමීම) හෝ කාඩ්පතෙහි ණය සීමාව ඉක්මවා ගනුදෙනු සිදු කිරීමට අවසර දීම හෝ සිය පරම අභිමතය පරිදි බැංකුව විසින් කළ හැකි වේ. යම් ප්‍රතික්ෂේප කිරීමක් වේ නම්, කාඩ්පත් හිමියා විසින් ඒ බව දන්වා සිටීම, දැනුම්දීම ලැබී දින 07ක් ඇතුළත සිදු කළ යුතු වේ. කාඩ්පතෙහි ණය සීමාව ඉහළ දැමීම සහ ණය සීමාව ඉහළ දැමීමෙන් පසු ගනුදෙනු සිදු කිරීම පිළිබඳ ප්‍රතික්ෂේප කිරීමක් නොලැබුණහොත්, කාඩ්පතෙහි ණය සීමාව ඉහළ දැමීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියාගේ නිසි කැමැත්ත ලබා දී ඇති ලෙසට සහ/හෝ අලුතින් ලබා දී ඇති ණය සීමාව සහිත නව ක්‍රෙඩිට් කාඩ්පත සඳහා කාඩ්පත් හිමියාගේ කැමැත්ත ලබා දී ඇති ලෙසට සැලකීමේ අයිතිය බැංකුව රඳවා ගනියි. කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුමේ නීතිරීති ප්‍රකාර, ඉන් අනතුරුව කාඩ්පත් හිමියා විසින් සිදු කරන ඕනෑම ගනුදෙනුවකට කාඩ්පත් හිමියා වගකිව යුතුය. ඔහු/ඇය වෙත දී ඇති ණය සීමාව සමාලෝචනය කිරීම සඳහා ඕනෑම අවස්ථාවක අයදුම් කිරීමේ හැකියාව ද කාඩ්පත් හිමියාට ඇත.

2.13 කිසිදු නීතිවිරෝධී කාර්යයක් සඳහා කාඩ්පත භාවිත නොකළ යුතුය.

## 3. බිල්ගත කිරීම සහ ගෙවීම

3.1 ප්‍රකාශන දිනය වන එක් එක් බිල්ගත කිරීමේ කාලසීමාවක අවසන් දින දී, ගෙවීමට නියමිත සමස්ත මුදල හා බැංකුව වෙත ගෙවීම සිදු කළ යුතු වන දිනය (ගෙවීම නියමිත දිනය) සම්බන්ධයෙන් ප්‍රකාශන දිනය (ගෙවීමට නියමිත සමස්ත මුදල/අවසන් ශේෂය), වත්මන් බිල්ගත කිරීමේ කාලසීමාව සඳහා කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු අවම ගෙවීම, පසුගිය හිඟ මුදල්, සහ සීමාව ඉක්මවීමේ හිඟ මුදල්, සීමාව ඉක්මවීමේ ගාස්තු, සහ සමස්ත අවම හිඟ මුදල (ගෙවීමට නියමිත අවම මුදල) වනවිට කාඩ්පත් ගිණුම මත ගෙවීමට නියමිතව හිඟව පවතින සමස්ත මුදල පිළිබඳ විස්තර සහිතව කාඩ්පත් හිමියා වෙත සාමාන්‍යයෙන් ප්‍රකාශනයක් යවනු ලැබේ.

3.2 සීමාව ඉක්මවා යාමේ හිඟ මුදල සහ සීමාව ඉක්මවා ගිය ගාස්තු, පසුගිය ප්‍රකාශන කාලසීමාවේ (කාලසීමා වල) සිට නොගෙවන ලද අවම ගෙවීම ද සමග ("පසුගිය හිඟ මුදල") වහාම ගෙවිය යුතුය. වහාම ගෙවිය යුතු වන මෙම කොටස් දෙකම "පසුගිය හිඟ මුදල සහ සීමාව ඉක්මවා ගිය ගාස්තු" වශයෙන් නිරූපණය විය යුතුය. බැංකුව වෙත කරන ලද ඕනෑම ගෙවීමක් බැංකුව විසින් දැනුම් දී ඇති ලිපිනයට ලැබී කාඩ්පත් ගිණුමට බැර වූ පසුව පමණක් බලපවත්වන්නේය. වැඩ කරන දිනයක දී ප.ව. 3.00 පසුව, මුදලින් කරන ලද යම් ගෙවීමක් ගිණුමට බැරවීම සඳහා අවම වශයෙන් වැඩ කරන දින එකක් අවශ්‍ය වන අතර, චෙක්පත් මගින් කරන ගෙවීම් එම චෙක්පත් නිශ්කාශනය වීමෙන් පසුව කාඩ්පත් ගිණුමට බැරවන්නේය. කාඩ්පත් හිමියා විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව හෝ බැංකුවෙහි පරම අභිමතය පරිදි හෝ, ප්‍රකාශන කාල සීමාවන් වෙනස් කළ හැකිය.

3.3 ගෙවීම් කළ යුතු නියමිත දින වල දී ගිවිසුම්ගත ගෙවිය යුතු අවම මුදල නොගෙවා සිටීම කාඩ්පත භාවිතය ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු වන්නේය.

3.4 කාඩ්පත් ගිණුමට කාඩ්පත් හිමියා විසින් කරනු ලබන ගෙවීම්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපිළිවෙකට කාඩ්පත් හිමියාගේ වගකීම් ගෙවා නිම කිරීම සඳහා අදාළ කරගනු ලැබේ.

3.5 ගෙවිය යුතු සමස්ත හිඟ මුදල, ප්‍රකාශනයෙහි දක්වා ඇති දිනය වනවිට සම්පූර්ණයෙන්ම ගෙවීමට නියමිතව හා ගෙවිය යුතුව පවතින අතර, මෙහි සඳහන් ගෙවීම් නියමිත දින දී බැංකුවෙහි වෙබ් අඩවියේ දක්වා ඇති ගෙවීම් කළ යුතු අවසන් වේලාවට පෙර හෝ ඊට පෙරාතුව කාඩ්පත් ගිණුමට බැර කිරීම සඳහා බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ගෙවීමක් ලැබුණහොත් කාඩ්පත් හිමියාට කිසිදු මූල්‍ය ගාස්තුවක් උපචිත නොවේ.

3.6 ගෙවිය යුතු සමස්ත හිඟ මුදල සම්පූර්ණයෙන්ම පියවා නොදැමීමට කාඩ්පත් හිමියා අදහස් කරන විට, එවැනි අවස්ථාවක දී ගෙවීම් නියමිත දිනයේ දී ගෙවීම් කළ යුතු අවසන් වේලාවට පෙර හෝ ඊට පෙරාතුව කාඩ්පත් හිමියා විසින් ගෙවීමට නියමිත අවම මුදල ගෙවීම කළ යුතු වේ. ගෙවීමට

නියමිත අවම මුදලට, පසුගිය බිල්ගත කිරීමේ කාලසීමාව (කාලසීමා වල) පවතින යම් නොගෙවන ලද අවම ගෙවීම් ද ඇතුළත් වේ.

බැංකුව වෙත කරන ලද ඕනෑම ගෙවීමක් බැංකුව විසින් දැනුම් දී ඇති ලිපිනයට ලැබී කාඩ්පත් ගිණුමට බැර වූ පසුව පමණක් බලපවත්වන්නේය.

3.7 කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් සිදු කරනු ලබන ගෙවීම්, මෙම නීතිරීති සහ කොන්දේසි යටතේ බැංකුව වෙත පවතින කාඩ්පත් හිමියාගේ වගකීම් පියවීමට හෝ ඒ සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපිළිවෙකට හෝ අදාළ කරගනු ලැබේ.

3.8 කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත කරන ලද ඕනෑම ගෙවීමක් කාඩ්පත් ගිණුමට බැර කරනු ඇත්තේ අදාළ කාඩ්පත් ගිණුම වෙත බැංකුව විසින් මුදල් පිළිබඳ සටහන පිටපත් කරන දිනයේ දී පමණි. වැඩ කරන දිනයක දී ප.ව. 3.00 පසුව, මුදලින් කරන ලද යම් ගෙවීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවම වශයෙන්, වැඩ කරන දින එකක් අවශ්‍ය වන අතර, චෙක්පත් මගින් කරන ගෙවීම්, එම චෙක්පත් නිශ්කාශනය වීමෙන් පසුව කාඩ්පත් ගිණුමට බැරවන්නේය.

3.9 ගෙවීම් කළ යුතු දිනයේ දී වූ කාඩ්පත් ගිණුම සඳහා වන කාඩ්පත් හිමියාගේ ප්‍රකාශනයේ සඳහන් ගෙවා අවසන් කළ යුතු සම්පූර්ණ ශේෂය හෝ අවම ගෙවිය යුතු මුදල සඳහා ගෙවීම් කටයුතු කරන ලෙස බැංකුවට දැනුම්දෙමින් කාඩ්පත් හිමියා විසින් තමාගේ ජංගම හෝ ඉතුරුම් ගිණුමට ("පියවීමේ ගිණුම") ඍජු හර ස්ථාවර නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකිය.

එවැනි යම් ස්ථාවර නියෝග පිළිබඳ වූ යම් සංශෝධන සහ අවලංගු කිරීම් (උදා: ස්වයංක්‍රීය බිල්පත් පියවීම්) ඊළඟ ගෙවීම් කළ යුතු දිනට අවම වශයෙන් සති දෙකකටවත් පෙරාතුව බැංකුව වෙත හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධවීම මගින් හෝ ලැබිය යුතු බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

3.10 බැංකුව සමග යම් ගිණුමක් ගෙවා අවසන් කිරීම පිළිබඳව ලබා දුන් ඍජු හර ස්ථාවර නියෝග සඳහා පහත දැක්වෙන අතිරේක නීතිරීති සහ කොන්දේසි අදාළ වන්නේය:

a. බැංකුවට ඉදිරිපත් කළ එවැනි යම් ස්ථාවර උපදෙසක් හෝ බැංකුව සමග ඇතිකරගත් වෙනත් යම් වැඩපිළිවළක් සම්බන්ධයෙන් දිය යුතු ප්‍රමුඛත්වය තීරණය කිරීමේ අයිතිය බැංකුව සතු බව කාඩ්පත් හිමියා පිළිගෙන සිටියි.
b. ගෙවීම් නියමිත දිනට පෙර දින, ස්ථාවර නියෝග ඉටුකිරීමේ කාර්යය සඳහා ණය පියවීමට අදාළ ගිණුම වෙත ප්‍රමාණවත් අරමුදල් සපයනු ලබන බවට කාඩ්පත් හිමියා එකඟ වේ. ගෙවීම් කළ යුතු දිනයේ දී ණය පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් නොවන ශේෂයක් පවතී

නම් එවිට, ගෙවිය යුතු මුදල අය කරගැනීම පිණිස කලින් කලට බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි අයිරා පහසුකම් ලබා දෙනු ඇත. එම අවස්ථාවේ එකී ණය පියවීමට අදාළ ගිණුමේ පවතින මුදල් මත පදනම් ව අය කරගැනීමේ ප්‍රමුඛත්වය ඉන් පසුව තීරණය කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබා ගනු ලැබේ. බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයක් යටතේ, මූල්‍ය ගාස්තු ද සමග සමස්ත හිඟ මුදල් ගෙවන ලෙස බැංකුව විසින් ඉල්ලා සිටීමේ දී එම මුදල ආපසු ගෙවීම සඳහා කාඩ්පත් හිමියා බැඳී සිටියි.

c. ගෙවීම් කළ යුතු දිනයේ දී ණය පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් නොවන ශේෂයක් පවතී නම් එවිට, එම අවස්ථාවේ එකී ණය පියවීමට අදාළ ගිණුමේ පවතින මුදල් මත පදනම් ව අය කරගැනීමේ ප්‍රමුඛත්වය ඉන් පසුව තීරණය කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ. මූල්‍ය ගාස්තු ද ඇතුළුව ඒ මත උපචිත වන සියලු ගාස්තු ගෙවීමේ වගකීමට කාඩ්පත් හිමියා යටත් වේ. උපදෙස් දෙන ලද සමස්ත මුදල අයකරගැනීම සඳහා, නම් කළ ණය පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවක දී, එම නම් කළ ණය පියවීමේ ගිණුමෙහි ඇති ඕනෑම මුදල් ප්‍රමාණයක් අය කරගැනීමට බැංකුවට අයිතිය ඇත.

3.11 ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් ව්‍යවහාර මුදල් වර්ග වලින් සිදු කරන ලද කාඩ්පත් ගනුදෙනු, කාඩ්පත් ගිණුමට හර කරනු ලබන්නේ, පරිවර්තනය සිදු කරනු ලබන දිනයේ දී, බැංකුව විසින් තීරණය කරනු ලබන පවත්නා අගයක් මත ශ්‍රී ලංකා මුදල් බවට පරිවර්තනය කිරීමෙන් අනතුරුව වේ.

3.12 ගනුදෙනුවක් අවලංගු කිරීම, ආපසු හැරවීම හෝ ආපසු ගෙවීම හේතුවෙන් සිදුවිය හැකි ඕනෑම විනිමය පාඩුවක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගවිය යුතු වේ.

3.13 මෙම ගිවිසුමේ වෙනත් විධිවිධානවලට අගති විරහිතව, කාඩ්පත් හිමියා එක් මසකට වැඩි කාලයකට ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම්, කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් පැහැදිලි සහ විශේෂිත උපදෙස් බැංකුව වෙත ලබාදිය යුතු අතර, ඔහුගේ/ඇයගේ බැහැරව යාමට පෙරාතුව, බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට උපදෙස් දීම කළ යුතු වේ.

3.14 කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් මාසිකව නිකුත් කරන ලද ප්‍රකාශනය කාඩ්පත් හිමියා විසින් සම්පූර්ණයෙන්ම පිරික්සිය යුතු අතර, යම් වරදක් වෙතොත් ඒ පිළිබඳව ප්‍රකාශන දිනයේ සිට දින 10ක් ඇතුළත බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම් දිය යුතු වේ. එකී කාලසීමාවෙන් පසු, ප්‍රකාශනය සහ එහි ඇතුළත් කිරීම් (දැනුම් දෙන ලද කිසියම් වරදක් හැර) නිවැරදි බවට බැංකුව සහ කාඩ්පත් හිමියා අවසානාත්මකව සලකනු ලබයි. කාඩ්පත් හිමියා විසින් ලිඛිතව බැංකුව වෙත සපයා ඇති මෑත

කාලීන ලිපිනය වෙත සියලු මුද්‍රිත ප්‍රකාශන සාමාන්‍ය තැපැල් මගින් එවනු ලබන අතර, පැය 48ක කාලයක් ඇතුළත එය කාඩ්පත් හිමියාට ලැබී ඇති බවට සලකනු ලැබේ.

a. මෙම ගිවිසුමේ වෙනත් විධිවිධානවලට අගති විරහිතව, කාඩ්පත් හිමියා එක් මසකට වැඩි කාලයකට සංක්‍රමණය වීමට හෝ වෙනත් රාජකාරි අරමුණු උදෙසා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම්, පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමක් (PFCA) මගින් කාඩ්පත් ගිණුම ගෙවා අවසන් කිරීමට කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත පැහැදිලි සහ නිසි උපදෙස් ලබාදිය යුතු අතර, ඔහුගේ/ඇයගේ බැහැරව යාමට පෙරාතුව, එකී උපදෙස් සම්බන්ධයෙන් බැංකුව වෙත දැනුම්දිය යුතු වේ.

b. ප්‍රකාශනයක් නොලැබීම, ගෙවීම් නොකිරීම සඳහා වලංගු හේතුවක් ලෙස සලකනු නොලැබිය යුතුය. {ප්‍රකාශනය උත්පාදනය කරන දින සිට දින දාහතර (14)ක් ඇතුළත ප්‍රකාශනය ලැබී නොමැති නම් හෝ අලුත් කාඩ්පතක් සම්බන්ධයෙන් වනවිට කාඩ්පත අනුමත වීමේ දින සිට දින දාහතරක් ඇතුළත ප්‍රකාශනය ලැබී නොමැති නම් හෝ, ඒ පිළිබඳව කාඩ්පත් හිමියා විසින් බැංකුවට දැනුම් දිය යුතුය.}

## 4. ගාස්තු සහ අය කිරීම්

(කාඩ්පත් වර්ගය අනුව ඇතැම් ගාස්තු, අය කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකිය. කරුණාකර සැලසුම් සඳහා අදාළ වන විස්තරය බලන්න).

4.1 අලුත් කාඩ්පත සඳහා වන සම්බන්ධ වීමේ සහ වාර්ෂික ගාස්තු ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වෙයි. ගෙවීම් නියමිත වනවිට, බැංකුවේ වත්මන් ගාස්තු ලේඛනයට අනුව, කාඩ්පත් ගිණුම වෙත ගාස්තු හර කෙරෙනු ඇත. ඕනෑම අවස්ථාවක දී අය කිරීම් වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුව පවතියි.

4.2 විදේශීය ලිපිනයක් වෙත කාඩ්පත කුරියර් කරනු ලබන අවස්ථාවක දී, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.3 තාවකාලික සහ/හෝ ස්ථිර සීමාව ඉහළ නැංවීමක් සඳහා, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.4 කාඩ්පත් ප්‍රකාශන වල දෙවැනි පිටපත් නිකුත් කිරීම සඳහා, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.5 ගෙවීම් නියමිත දිනයේ දී කාඩ්පත් හිමියා විසින් සමස්ත හිඟ ශේෂය පියවීම සිදු නොකරයි නම්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, ප්‍රකාශන දිනයේ පවතින හිඟ ශේෂයට ගනුදෙනු දිනයේ සිට බිල්ගත කාලසීමාවේ දී දෛනික ශේෂය මත ගණනය කෙරෙනු ඇති මූල්‍ය ගාස්තුවක් අය කෙරෙනු ඇත. ප්‍රකාශන දිනයේ දී කාඩ්පත් ගිණුම වෙත මූල්‍ය ගාස්තුව හර කරනු ලැබේ.

4.6 ඉහත 4.5 හි සඳහන් කර ඇති මූල්‍ය ගාස්තු ගෙවීමට අගති විරහිතව, ගෙවීම් නියමිත දිනය වනවිට ගෙවීමට නියමිත අවම මුදල ගෙවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, ප්‍රමාද ගාස්තුවක් අයකර, කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.7 කාඩ්පත් හිමියා හෝ වෙනත් ඕනෑම පාර්ශ්වයක් විසින් බැංකුව වෙත නිකුත් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද කිසියම් චෙක්පතක් හෝ වෙනත් ගෙවීම් නියෝගයක් හෝ ඕනෑම හේතුවක් මත අගරු වුවහොත්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් හිමියාගෙන් අයකර, බැංකුව විසින් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.8 කාඩ්පත් ගිණුමට හර කරනු ලබන සියලුම මුදල් අත්තිකාරම් සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව මුදල් අත්තිකාරම් ගාස්තුවක් සහ/හෝ හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. කාඩ්පත මත මිලදී ගනු ලැබූ, වහාම මුදල් බවට පත් කළ හැකි ඉල්ලුම් අණකරයක්, ටෙලිග්‍රැෆික් පැවරුමක් වැනි ඕනෑම සාධනපත්‍රයක් ද මුදල් අත්තිකාරම් වශයෙන් සලකනු ලබන අතර, ඒවා, ඉහත ගාස්තු වලට විෂය වේ.

4.9 බිල්ගත කිරීමේ කාලසීමාවේ දී යම් අවස්ථාවක දී, කාඩ්පත මත පවරා දී ඇති ණය සීමාව ඉක්මවන ලද නම්, එවිට සීමාව ඉක්මවීමේ ගාස්තුවක් වශයෙන් ද හැඳින්වෙන අතිරික්ත සීමා ගාස්තුවක් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව අයකර, කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

ණය සීමාව ඉක්මවා තිබේද යන්න ගණනය කරන අවස්ථාවන් හි දී, යම් පොලී මුදලක්, අය කරන ලද බදු සහ බැංකු ගාස්තු ද සැලකිල්ලට ගනු ලැබේ.

4.10 ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් වලින් මිල දී ගනු ලබන සියලු පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ වෙනත් සැපයුම්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව කාඩ්පත් ගිණුමෙන් හරවිය යුතු මෙහෙයුම් ගාස්තුවකට යටත් වන්නේය.

4.11 ශ්‍රී ලංකාව හැර වෙනත් රටක දී, 2016 ජනවාරි 01 දිනට පසුව, යම් ගනුදෙනුවක් සිදු කරන අවස්ථාවේ දී කාඩ්පත ඉදිරිපත් කළ ද, නොකළ ද, එකී සෑම ක්‍රෙඩිට් කාඩ්පත් ගනුදෙනුවක් සඳහාම ක්‍රෙඩිට් කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමට මුද්දර ගාස්තු අය කෙරෙනු ඇත. කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම්දීමකින් තොරව කලින් කලට සංශෝධනය විය හැකි මෙය ව්‍යවස්ථාපිත අය කිරීමකි.

4.12 ගතික මුදල් පරිවර්තන (DCC) යනු Visa / Master සේවාවක් නොවන බව සහ වෙළෙඳ මහතුන් හා ATM යන්ත්‍ර විසින් එය පිරිනමනු ලබන්නේ ඔවුන්ගේ ලැබුම්කාර බැංකු හරහා බව කාඩ්පත් හිමියන් සැලකිල්ලට ගත යුතු වේ. ගනුදෙනුව නිම කරන අවස්ථාවේ දී වෙළෙඳ මහතා හෝ ATM යන්ත්‍රය විසින් කාඩ්පත් හිමියා එකඟ වූ ව්‍යවහාර මුදල් වර්ගයට, ප්‍රචාරණය කළ මිල පරිවර්තනය කරනු ඇති අතර, සාමාන්‍යයෙන් පරිවර්තනය-ආශ්‍රිත දළ ලාභයක් (තොග විනිමය අනුපාතිකය හෝ රජය විසින් නියම කළ අනුපාතිකය මත) එහිදී නියම කරනු ඇත. DCC පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ විකල්පයක් කාඩ්පත් හිමියා වෙත පිරිනමනු ඇති අතර, වෙළෙඳ මහතා හෝ ATM යන්ත්‍රය විසින් ගනුදෙනුව සම්බන්ධයෙන් කටයුතු කිරීමට පෙරාතුව, DCC විකල්පය සක්‍රීයව තෝරාගැනීම කළ යුතු වේ. කාඩ්පත් හිමියා විසින් DCC ප්‍රතික්ෂේප කරන්නේ නම්, වෙළෙඳ මහතා හෝ ATM යන්ත්‍රය විසින් සිය දේශීය මුදල් වර්ගයෙන් ගනුදෙනුව සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. විනිමය අනුපාතික වල වෙනස පිළිබඳ අවදානම අවම කිරීම පිණිස, ගතික ව්‍යවහාර මුදල් පරිවර්තන හෝ බහුවිධ-ව්‍යවහාර මුදල් ගනුදෙනු ආකාරයෙන් සිදු කර ශ්‍රී ලංකා රුපියල් (ශ්‍රීලංරු) වලින් බිල්ගත කරන ලද නමුත් විදේශීය වෙළෙඳ මහතුන්/සේවා සැපයුම්කරුවන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචිව ඇති වෙබ්අඩවි වලින් සිදු කරන ලද සියලු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රීලංරු ගනුදෙනු වටිනාකම මත, සැකසුම් ගාස්තුවක් අය කෙරෙනු ඇත. මෙය බැංකුව විසින් පනවනු ලබන ගාස්තුවක් වන අතර, වෙළෙඳපොළ අනුපාතික උච්ඡාවචනය මත කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම්දීමකින් තොරව කලින් කලට සංශෝධනය විය හැකිය.

**5. අතිරේක කාඩ්පත් සහ/හෝ පරිපූරක කාඩ්පත්**

අතිරේක/පරිපූරක කාඩ්පත් නිකුත් කරනු ලබන්නේ පවුලේ ළඟම සාමාජිකයන් වෙත පමණි.

5.1 කාඩ්පත් හිමියා සහ අතිරේක/පරිපූරක කාඩ්පත් හිමියා (හිමියන්) විසින් හවුල්ව සහ ලිඛිතව සිදු කරනු ලබන ඉල්ලීමක් අනුව, බැංකුවෙහි අභිමතය පරිදි බැංකුව විසින් අතිරේක කාඩ්පත (කාඩ්පත්) /පරිපූරක කාඩ්පත (කාඩ්පත්) නිකුත් කරනු ඇත. තම කාඩ්පත් ගිණුම් සම්බන්ධිතව හෝ වෙන වෙන ම හෝ පවතින ඒවා වුවද, කාඩ්පත භාවිතය සහ අතිරේක කාඩ්පත (කාඩ්පත්) / පරිපූරක කාඩ්පත (කාඩ්පත්) භාවිතය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සහ අතිරේක/පරිපූරක කාඩ්පත් හිමියා (හිමියන්) යන දෙපාර්ශ්වය ම එක් ව හා වෙන් වෙන් ව වගකීමට බැඳී සිටියි. ඕනෑම සහ/හෝ සෑම

අතිරේක/පරිපූරක කාඩ්පත් හිමියකු (හිමියන්), මෙම ගිවිසුමෙහි නීතිරීති සහ කොන්දේසි වලින් බැඳී සිටිනු ඇත.

යම් සැකයක් ඇතිවීම මග හරවා ගැනීම පිණිස, කාඩ්පත භාවිත සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සහ අතිරේක / පරිපූරක කාඩ්පත් හිමියා (හිමියන්) එක් ව සහ වෙන් වෙන් ව වගවීමට අමතරව, කාඩ්පත් හිමියා සහ අතිරේක / පරිපූරක කාඩ්පත් හිමියා (හිමියන්) යන දෙපාර්ශ්වය ම විසින් උපචිත යම් හෝ සියලුම වගවීම් සම්බන්ධ අවසාන වගවීම කාඩ්පත් හිමියා විසින් දරනු ලබයි.

5.2 ඉහත 5.1 වගන්තියෙහි කුමක් සඳහන් වුවද, කාඩ්පත් හිමියාගෙන් සෘජුව යැපෙන්නකු /යැපෙන්නන් වන, වයස අවුරුදු 16 සිට 18 අතර වයසෙහි බාලවයස්කරුවකු (කරුවන්) වෙත බැංකුව විසින් අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කිරීමක් කාඩ්පත් හිමියකුට අවශ්‍ය වුවහොත්, එවැනි බාලවයස්කරුවකු (කරුවන්) වෙත අධ්‍යාපනය පහසුකරවීමේ අරමුණ උදෙසා පමණක් එවැනි අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කරන ලෙසට කාඩ්පත් හිමියා විසින් ලිඛිත ඉල්ලීමක් බැකුව වෙත නිකුත් කළ යුතුය. එවැනි අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) බැංකුව විසින් නිකුත් කිරීම බැංකුවේ පරම අභිමතය මත සිදු කරනු ඇත. ඉහත කී පරිදි, බාලවයස්කරුවන් වෙත අතිරේක ක්‍රෙඩිට් කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කරන ලබන අවස්ථාවන් හි දී, එකී පරිපූරක කාඩ්පත් හිමියා / හිමියන් විසින් සිදු කරන ලද එක් එක් සහ සෑම ගනුදෙනුවක්ම කාඩ්පත් හිමියාගේ වගකීමක් වන අතර, කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) විසින් ඇති කරනු ලබන සියලු වගකීම්වල අවසාන වගකීම කාඩ්පත් හිමියා විසින් දරනු ඇත.

මූලික සහ පරිපූරක කාඩ්පත් හිමියන් සඳහා වූ වාර්ෂික ගාස්තු, මූලික කාඩ්පත ආරම්භ කිරීමේ වාර්ෂික දිනයේ දී අයකරනු ලැබිය යුතුය.

5.3 යම් අමතර අතිරේක කාඩ්පත් හිමියෙකු (හිමියන්) විසින් ඉල්ලා සිටින පරිදි සහ ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී එවැනි ඕනෑම අමතර අතිරේක කාඩ්පත් හිමියෙකු (හිමියන්) වෙත, කාඩ්පත් හිමියාගේ ගිණුමෙහි දැක්වෙන ඇති ගනුදෙනු පිළිබඳ විස්තර සහ වෙනත් පුද්ගලික දත්ත ද ඇතුළුව, නමුත් ඒට සීමා නොවී, කාඩ්පත් හිමියා සහ අමතර අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) යන දෙදෙනා විසින්ම සිදු කරන ලද ගනුදෙනු වලට අදාළ යම් හෝ සියලු තොරතුරු බැංකුව විසින් හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශිතව සහ අවලංගු කළ නොහැකි පරිදි කාඩ්පත් හිමියා විසින් මෙමගින් කැමැත්ත පළ කර සිටියි. එසේ ලබා දුන් කැමැත්තට අනුව, කාඩ්පත් හිමියාගේ ගිණුම සම්බන්ධයෙන් ඕනෑම අමතර අතිරේක කාඩ්පත් හිමියෙකු (හිමියන්) වෙත බැංකුව විසින් යම් ගනුදෙනු තොරතුරක් හෝ වෙනත් දත්ත හෝ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් එමගින් පැන නගිනු ලබන ප්‍රමාණයකට, යම් හෝ සියලු පාඩු, හානි, පොලී, පිරිවැය, හිමිකම් පෑම්, ඉල්ලීම්, නඩුකර, සිවිල් නඩු, නඩු කටයුතු, අය කිරීම්, වියදම් සහ වර්තමාන හෝ අනාගත යම් බදු, අයකිරීම්, අයබදු, තීරුබදු, ගාස්තු කොමිස්, හෝ ඕනෑම ආකාරයක හෝ වෙනත් වගකීම් කිසිවක් හෝ සියල්ලට එරෙහිව බැංකුව හානිපූරණය කිරීමට, පෙනී සිටීමට, සහ නිදහස්ව තැබීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

## 6. ATM යන්ත්‍ර / අන්තර්ජාල බැංකුකරණ / ජංගම බැංකුකරණ / සහ පුද්ගල හඳුනාගැනීමේ අංකය (PIN)

6.1 ක්‍රෙඩිට් කාඩ්පත වෙතට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) / අන්තර්ජාල බැංකුකරණය/ජංගම බැංකුකරණ ප්‍රවේශ පහසුකම එක්කර ඇති අවස්ථාවක දී, ATM යන්ත්‍ර වෙත දී හෝ ගෙවීම් සිදු කරනු ලබන ස්ථානයන් (POS) හි දී හෝ අන් අයුරින් බැංකු ගනුදෙනු සිදු කිරීම සඳහා එකී ක්‍රෙඩිට් කාඩ්පත් විසින් එකී ඉලෙක්ට්‍රොනික ආකාරයන් භාවිත කළ හැකිය. එම පහසුකම් භාවිත කිරීම, මෙම ගිවිසුමෙහි දැක්වෙන නීතිරීති සහ කොන්දේසි වලට අමතරව, ATM යන්ත්‍ර / ජංගම බැංකුකරණ/අන්තර්ජාල බැංකුකරණ පිළිබඳ බැංකුවේ නීතිරීති සහ කොන්දේසි වලට ද විෂය වන අතර, ඉල්ලා සිටි විටෙක ඕනෑම ශාඛාවක් වෙතින් එහි පිටපතක් ලබාගැනීමේ හැකියාව පවතියි.

6.2 කාඩ්පත් හිමියන් විසින් ATM යන්ත්‍ර වෙතින් / දුරකථන මගින්, අන්තර්ජාල බැංකුකරණය හරහා සහ/හෝ ජංගම බැංකුකරණය මගින් සිදු කළ ගනුදෙනු සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් බැංකුව විසින් විමර්ශනය කරනු ලැබිය යුතු අතර, බැංකුව සෑහීමට පත්වන පරිදි අන්‍යාකාරයකින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඉහත කී ක්‍රම මගින් සිදු කරන ලද ඕනෑම ගනුදෙනුවක් පිළිබඳ වගකීම කාඩ්පත් හිමියා සතු වේ.

6.3 මෙහි අන්තර්ගත කරුණුවලට පටහැනිව කුමක් සඳහන් වුවද, ATM ගනුදෙනු සඳහා PIN අංකය ද ඉදිරිපත් කළ යුතු වන බැවින් නැති වූ කාඩ්පතක් පිළිබඳ වාර්තාකර තිබීම, වගන්ති අංක 6.2 යටතේ සඳහන් වගකීම අත්හිටුවීමට හෝ අහෝසි කිරීමට හේතු නොවිය යුතුය. PIN අංකය ආරක්ෂා කිරීමට, සුරැකීමට සහ කාඩ්පතෙන් PIN අංකය වෙන්කර තැබීමට කාඩ්පත් හිමියන්ට විශේෂයෙන් ම උපදෙස් දී ඇති අතර, එසේ කිරීමට අපොහොසත්වීම ඒ සම්බන්ධයෙන් පැන නගින ඕනෑම වගකීමක් භාරගැනීමක් ලෙස සලකනු ලැබේ.

## 7. කෙටි පණිවුඩ සංඥා (SMS Alerts) පහසුකම

7.1 "කෙටි පණිවුඩ සංඥා" (SMS) යනු, කාඩ්පත් හිමියා විසින් බැංකුවෙහි ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකය වෙත SMS මගින් එවනු ලබන, විශේෂයෙන් සකසනු ලැබූ පණිවුඩ වේ. කාඩ්පතින් ගෙවීම් සිදු කිරීමට අනුමත කරන ලද ගනුදෙනුව පිළිබඳ සංඥාවක් කාඩ්පත් හිමියන් වෙත සැපයීම මෙම සේවාව මගින් සිදුකරනු ලබයි.

7.2 "ක්‍රෙඩිට් කාඩ්පත් පිළිබඳ කුඩා ප්‍රකාශන" නම් වූ විශේෂිත SMS සන්නිවේදන හැරුණුවිට, අභ්‍යන්තරික අවසාන දිනයන්ට අනුව බැංකුව විසින් "ගෙවීම් පිළිබඳ සිහිකැඳවීම්" ද උත්පාදනය කරනු ඇති අතර, බැංකුව සමග ලියාපදිංචි කර ඇති කාඩ්පත් හිමියාගේ ජංගම දුරකථන අංකය වෙත එය සන්නිවේදනය කෙරෙනු ඇත.

7.3 ශ්‍රී ලංකාව තුළ වන සන්නිවේදන යටිතල ව්‍යුහයන්, සබැඳුම් සහ සේවාවන් මත SMS සංඥා පහසුකම යැපෙන බැව් කාඩ්පත් හිමියා පිළිගනියි. බැංකුව විසින් එවන ලද SMS සංඥාවල කාලානුරූප බව, සන්නිවේදන කර්මාන්තයට බලපාන කරුණු මත රඳා පවතින බව කාඩ්පත් හිමියා පිළිගනියි. කාඩ්පත් හිමියා වෙත SMS සංඥා බෙදා-නොහැරීම හෝ ප්‍රමාද වී බෙදා හැරීම, සම්ප්‍රේෂණයේ දී සිදුවන දෝෂ, හානි, විකෘති වීම් සහ සම්ප්‍රේෂණය කෙරෙන වැරදි සහගත SMS සංඥා සම්බන්ධයෙන් බැංකුව වග කියනු නොලබයි.

7.4 කාඩ්පත් හිමියා විදේශ සංචාරයක නිරත වන අවස්ථාවක දී SMS සංඥා ලැබීමට නම්, roaming යාවත්කාලීන කිරීමට සහ/හෝ ජාත්‍යන්තර ජංගම දුරකථන අංකය ලබාදීමට හෝ කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත දැනුම් දිය යුතු වේ. නෛතික, නියාමන අවශ්‍යතාවන් හා සීමා කිරීම් හේතුවෙන් ඇතැම් රට වල/කලාප වල දී SMS සංඥා පහසුකම නොපැවතිය හැකිය.

7.5 ඕනෑම අවස්ථාවක දී සිය තනි සහ පූර්ණ අභිමතය මත පූර්ව දැනුම්දීමකින් තොරව සහ ඒ සඳහා කිසිදු හේතුවක් දැක්වීමකින් තොරව සහ කාඩ්පත් හිමියා විසින් පූර්වයෙන් මෙම නීතිරීති කඩකිරීමක් සඳහා නඩු පැවරීමේ සිය අයිතීන් කිසිවකට අගති විරහිතව, SMS සංඥා පහසුකමට යම් වෙනස්කමක් සිදු කිරීමට, SMS සංඥා පහසුකම නැවැත්වීමට සහ/හෝ අවසන් කිරීමට සහ SMS සංඥා පහසුකම පිළිබඳ නීතිරීති වෙනස් කිරීමට බැංකුවට සහ/හෝ සමාගම් වලට අයිතිය පවතියි.

7.6 බැංකුව වෙත ලියා එවීම මගින් හෝ බැංකුව විසින් සත්‍යාපනය කිරීමට යටත් ව, බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා, ජංගම දුරකථන අංකය වෙනස් කිරීම සඳහා කාඩ්පත් හිමියාට ඉල්ලා සිටිය හැක. කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටින සංශෝධන/ය සිදුකිරීම සඳහා බැංකුව විසින් වැඩකරන දින තුන (03)ක් දක්වා කාලයක් ගත හැකිය.

7.7 SMS සංඥා පහසුකම, බැංකුවෙහි වෙබ් අඩවියේ සේවා ගාස්තු යටතේ ලබාගත හැකි සහ බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව, කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇති හැසිරවීමේ ගාස්තුවකට විෂය වේ.

**8. අවසන් කිරීම**

8.1 කාඩ්පත් හිමියා සහ සිටී නම්, ඕනෑම යම් අතිරේක සහ පරිපූරක කාඩ්පත් හිමියකු විසින් ඕනෑම අවස්ථාවක දී බැංකුව වෙත ලිඛිත දැනුම්දීමක් සමග කොටස් දෙකක් ලෙසට කපා දමන ලද කාඩ්පත සහ යම් අතිරේක / පරිපූරක කාඩ්පත (කාඩ්පත්) ආපසු භාරදීමෙන් පසුව මෙම ගිවිසුම අවසන් කරනු ලැබිය හැකිය.

8.2 බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි, පූර්ව දැනුම්දීමක් සහිතව හෝ රහිතව සහ කිසිදු හේතුවක් සහිතව හෝ රහිතව ඕනෑම අවස්ථාවක දී කාඩ්පත අවලංගු කරමින් හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ මෙම ගිවිසුම අවසන් කළ හැකි වේ. එසේ අවසන් කිරීම සිදු කරනු නොලැබුවේ නම් හෝ සිදු කරනු ලබන තෙක් හෝ බැංකුව විසින් කලින් කලට කාඩ්පත් හිමියා වෙත අලුත් කාඩ්පතක් ('අලුත් කරන ලද කාඩ්පත') සපයනු ලැබිය හැකිය.

8.3 විදේශ විනිමය පාලනය වන නීතිරීති සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි/විධාන වල සඳහන් අවසන් කිරීමේ විධිවිධාන වලට යටත් ව සහ ඉහත 8.2 වගන්තියෙහි විධිවිධානයන් එතකුදු වුවත්, පහත අවස්ථාවන් හි දී, මෙම ගිවිසුම අවසන් කිරීමට සහ අවලංගු කිරීමට සහ/හෝ වහාම ක්‍රියාත්මක වන පරිදි කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බැංකුවට හිමිකම පවතී;

(i) මෙම ගිවිසුමෙහි නීතිරීති සහ/හෝ මෙම ගිවිසුම හා බැඳුණු වෙනත් ඕනෑම නීතිරීති සහ කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට කාඩ්පත් හිමියා විසින් අපොහොසත් වීම සහ/හෝ කඩකිරීම;

(ii) කාඩ්පත් හිමියා විසින් සිදු කරන පැහැර හැරීමක දී හෝ බැංකුව සමග එළැඹ ඇති කිසියම් ගිවිසුමක්, පිළියෙළ කිරීමක් හෝ බැඳීමක් (නිශ්චිත නොවන හෝ අන්‍යාකාර) යටතේ සිදු කරන පැහැර හැරීමක්;

(iii) කාඩ්පත් හිමියා යම් බංකොලොත් හෝ බුන්වත්භාවය පිළිබඳ නඩුවක හෝ ඊට සමාන නඩු කටයුතු වල විෂය වස්තුව වී තිබීම;

(iv) කාඩ්පත් හිමියාගේ මරණය සිදුවීම.

8.4 කාඩ්පත් ගිණුමෙන් අය විය යුතු එහෙත් තවමත් කාඩ්පත් ගිණුමෙන් අය කරගෙන නොමැති හිඟ මුදල් ද සමග කාඩ්පත් ගිණුමේ හිඟව පවත්නා ගෙවිය යුතු සමස්ත හිඟ ශේෂය මෙම ගිවිසුම අවසන් කිරීමේ දී හෝ කාඩ්පත් හිමියාගේ වස්තුභංගත්වයක දී හෝ කාඩ්පත් හිමියා මියයෑමේ දී වහාම සහ සම්පූර්ණයෙන්ම ගෙවීමට නියමිතව සහ අය විය යුතු වන්නේය. කාඩ්පත් ගිණුමේ හිඟ මුදල් ගෙවා නිම කිරීම සඳහා කාඩ්පත් හිමියා හෝ ඔහුගේ / ඇයගේ බූදලය වගකීමට බැඳිය යුතු අතර, එම අය විය යුතු හිඟ මුදල් ආපසු අයකර ගැනීමේ දී බැංකුව විසින් දරන ලද සියලු පිරිවැය, ගාස්තු, (නීති ගාස්තු ද ඇතුළුව), සහ වියදම් සඳහා බැංකුව හානිපූරණය කර නිදහස්ව තැබිය යුතුය. එකී කාඩ්පත් ගිණුමෙහි පවතින සමස්ත හිඟ මුදල පියවා නොමැති නම් සහ පියවා දමන තෙක්, බැංකුවෙහි පවත්නා අනුපාත(ය) අනුව මූල්‍ය ගාස්තු සහ වෙනත් ගාස්තු සහ අය කිරීම් අඛණ්ඩව අයකරවා ගැනීම සඳහා ක්‍රියා කිරීමට බැංකුවට හිමිකමක් ඇත්තේය.

8.5 එක් පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම අවසන් කළ ද එය නොතකා, කාඩ්පත් ගිණුම මත වන සමස්ත හිඟ මුදල (පොලී, බදු සහ අය කිරීම් ඇතුළුව) කාඩ්පත භාවිත කිරීම මගින් උපචිත වන තවදුරටත් වූ සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා සහ හෝ ඔහුගේ/ඇයගේ බූදලය අඛණ්ඩ ව වගකීමට බැඳී සිටිය යුතුය.

## 9. කාඩ්පත නැතිවීම

9.1 කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම සිදු වී ඇති බවට අනාවරණය වූ පසු, වහාම එකී නැතිවීම/සොරකම් කිරීම පිළිබඳව දුරකථනයෙන් හෝ විද්‍යුත් තැපැල් මගින් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට සහ ලිඛිතව පොලීසිය වෙත (හෝ, විදේශයන් හි දී නම්, Visa කාඩ්පතක් නම් ඕනෑම Visa සාමාජිකයකු වෙත සහ MasterCard කාඩ්පතක් නම් ඕනෑම MasterCard සාමාජිකයකු වෙත) වාර්තා කරනු ලැබිය යුතුය. නමුත්, එවැනි යම් අවස්ථාවක දී, දුරකථන, හෝ විද්‍යුත් තැපැල් මගින් කරන ලද එම පණිවුඩයෙන් පසුව කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු විසින් යථා පරිදි බලය දුන් ඇටෝර්නි බලකරු විසින් අත්සන්කර වහාම ලිඛිතව තහවුරු කරනු ලැබිය යුතුය. කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම ඉහත කී ආකාරයට අවස්ථාවෝචිත පරිදි බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත හෝ Visa/MasterCard සාමාජිකයකු වෙත දැනුම් දී, පසුව එම සොරකම් කිරීම හෝ නැතිවීම ලිඛිතව තහවුරු කිරීම කරනු ලබන තෙක් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීම හේතුවෙන් කාඩ්පත් ගිණුමට බැරවී ඇති සියලු මුදල් සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය. නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පත (කාඩ්පත්), කාඩ්පත් හිමියා විසින් නැවත සොයා ගනු ලැබූ අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් වහාම බැංකුව වෙත එම ලැබුණු කාඩ්පත (කාඩ්පත්) ආපසු භාරදිය යුතුය.

9.2 කාඩ්පත නැතිවීම, සොරකම් කිරීම හෝ සාවද්‍ය ලෙස භාවිතය සිදුවී ඇති අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් කාඩ්පත පිළිබඳ තමාගේ සන්තකයේ පවතින සියලු විස්තර බැංකුව වෙත ලබාදිය යුතු අතර, එම නැතිවී ඇති කාඩ්පත සොයා ගැනීම සඳහා සහාය වීම පිණිස, බැංකුව විසින් ඉල්ලා සිටින පරිදි, ගනු ලැබිය යුතු බවට සලකනු ලබන සියලු පියවර ගනු ලැබිය යුතුය.

9.3 කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම හේතුවෙන් කාඩ්පත් හිමියාට ප්‍රතියෝජන කාඩ්පතක් නිකුත් කිරීම සඳහා බැංකුව කිසිදු බැඳීමකට යටත් නොවන්නේය. ඕනෑම ප්‍රතියෝජන කාඩ්පතක්, බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුපාතිකයක් මත කාඩ්පත් ගිණුමට බැරවිය යුතු හැසිරවීමේ ගාස්තුවකට විෂය වන අතර, බැංකුව විසින් තීරණය කිරීමේ දී, මුල් කාඩ්පත සම්බන්ධයෙන් වූ සමාන නීතිරීති සහ කොන්දේසි වලට යටත්ව එම ප්‍රතියෝජන කාඩ්පත නිකුත් කරනු ලැබේ.

**10. පොදු**

10.1 තමන් වෙත පවරා ඇති ණය සීමාව ඉක්මවීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙතින් පූර්ව ලිඛිත අනුමැතියක් ලබාගෙන නොමැති නම් මිස, පවරන ලද ණය සීමාව තුළ සිටීමට කාඩ්පත් හිමියා පොරොන්දු වන අතර, සමස්ත හිඟ මුදල, එකී ණය සීමාවන් ඉක්මවීමට හේතුවන කිසිදු ගනුදෙනුවක් සිදු නොකිරීමට ද වැඩිදුරටත් පොරොන්දු වේ.

10.2 කාඩ්පත් හිමියා විසින් අයදුම්පත මගින් ලබාදී ඇති තොරතුරු ද ඇතුළුව නමුත්, ඊට සීමා නොවී, ලිපිනයන්, සේවානියුක්තිය පිළිබඳ විස්තර, දුරකථන අංක (සියල්ල සාමූහිකව 'සම්බන්ධ කරගැනීමේ විස්තර' යනුවෙන් හැඳින්වේ) වෙනස් වීම පිළිබඳව නොපමාව බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතුය. කාඩ්පත පිළිබඳ අයදුම්පතෙහි සඳහන් සම්බන්ධ කරගැනීමේ විස්තර, වඩාත් යාවත්කාලීන කළ සම්බන්ධ කරගැනීමේ විස්තර ලෙස බැංකුව විසින් සලකනු ලැබේ. මෙම වගන්තියෙහි දක්වා ඇති පරිදි, කාඩ්පත පිළිබඳ අයදුම්පතෙහි සඳහන් සම්බන්ධ කරගැනීමේ තොරතුරු ප්‍රතියෝජනය කිරීම හා එසේ පවත්වාගෙන යාම, තොරතුරු වෙනස්වීම පිළිබඳව බැංකු වෙත දැනුම්දීමේ දී සිදු කෙරෙනු ඇත.

10.3 කාඩ්පත් හිමියා වෙත කරනු ලබන යම් නිවේදනයක් හෝ කාඩ්පත් හිමියා සමග කරනු ලබන යම් ලිපි ගනුදෙනුවක්, බැංකුව වෙත කාඩ්පත් හිමියා විසින් සපයා ඇති අලුත්ම ලිපිනයට යවනු ලබන අතර, තැපැල් කිරීමෙන් දින හත (07)ක කාලයක් ඇතුළත ඒවා කාඩ්පත් හිමියා වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබේ.

10.4 බැංකුව විසින් අවශ්‍ය කෙරෙන ඕනෑම අවස්ථාවක දී, කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු බැංකුවට ලබා දිය යුතුය. එසේ සපයන ලද තොරතුරු විමසා බලා තහවුරු කරගැනීම සඳහා කාඩ්පත් හිමියා බැංකුවට තවදුරටත් බලය ලබා දෙන්නේය. එසේ ඉල්ලා සිටීමේ දී බැංකුව වෙත තොරතුරු සපයා නොමැති නම්, බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ වහාම කාඩ්පත අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

10.5 බැංකුව වෙත පවතින (කාඩ්පත් හිමියා විසින් හෝ අන්‍යාකාරයකින් සපයන ලද) සාක්ෂි මත පදනම්ව, කාඩ්පත් හිමියා විසින් ස්වකීය කාඩ්පත් ගිණුම හෝ කාඩ්පත භාවිත කිරීමේ දී (කාඩ්පත, ගිණුම හෝ PIN අංකය ආරක්ෂා කිරීම සහ කාඩ්පත නැතිවීම හෝ අනවසර ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීම ද මීට ඇතුළත් වේ) නොසැලකිලිමත්ව හෝ වංචා සහගත ලෙස ක්‍රියාකර ඇති බව බැංකුවේ මතය වන අවස්ථාවක, කාඩ්පත මගින් සිදුකර ඇති යම් අනවසර ගනුදෙනු සම්බන්ධයෙන්, කාඩ්පත පිළිබඳව කාඩ්පත් හිමියාගේ වගකීම ඉහළ නැංවේ. කාඩ්පත මගින් සිදු කරන ලද ඇතැම් විශේෂිත ගනුදෙනු සහ වෙළෙඳ මහතුන්ගේ කාණ්ඩයන් වෙත දී සිදුකරන ලද විශේෂිත ගනුදෙනු සඳහා නිශ්චිත විමර්ශන අවශ්‍ය බවට බැංකුව තීරණය කරනු ලබයි නම්, සහ කාඩ්පත් හිමියාගේ ගිණුම් ඉතිහාසය අසතුටුදායක වේ නම්, හෝ ගනුදෙනුවල ස්වාභාවය අනුව කාඩ්පත් හිමියා වෙත මුදල් ප්‍රතිපූරණය නොකළ යුතු බවට සනාථ කරයි නම්, හබකර සිටිනු ලබන යම් ගනුදෙනු සඳහා බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත මුදල් ප්‍රතිපූරණය නොකරන බවට කාඩ්පත් හිමියා එකඟව, පිළිගනියි.

10.6 සහභාගිවන්නාට කාඩ්පත හරහා මුදල් හෝ මූල්‍ය වටිනාකමක් දායක කරන ලෙස හෝ ගෙවන ලෙස නියම කරනු ලබන්නා වූ ද සහභාගීවන්නන් උපයනු ලබන ප්‍රතිලාභ විශාල වශයෙන් පහත කරුණු මත රඳා පවත්නා විට, එවැනි සැලසුමක් කාඩ්පත් හිමියා විසින් ඍජු ව හෝ වක්‍රව පිරිනැමීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරණය, මෙහෙයවීම, මුදල් සැපයීම, කළමනාකරණය හෝ යොමු කිරීම නොකළ යුතු වේ:

(a) සැලසුම සඳහා සහභාගිවන්නන්ගේ ප්‍රමාණය වැඩිවීම මත රඳාපවතින්නා වූ ද; හෝ

(b) සැලසුම සඳහා සහභාගිවන්නන්ගේ දායකත්වය වැඩිවීම මත රඳාපවතින්නා වූ ද;

කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමට බැංකුව විසින් වැරදි ලෙස මුදල් බැරකර ඇති විටෙක, එම ඇතුළත් කිරීම ප්‍රතිශෝධනය කිරීම සඳහා සහ/හෝ එම මුදල කාඩ්පත් හිමියාගෙන් ඉල්ලා සිටීමට හෝ ඕනෑම අවස්ථාවක බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

10.7 කාඩ්පත් ගිණුමේ පවත්නා යම් අයවිය යුතු සමස්ත මුදල/මුදල සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ ඕනෑම ආකාරයකට ආපසු ලබාගැනීම සඳහා, කාඩ්පත් හිමියා වෙත නිසි දැනුම්දීමක් සහිතව, ණය එකතු කිරීමේ තුන්වන පාර්ශ්වයක නියෝජිතයන්ට පැවරීමේ අයිතිය බැංකුව රඳවා ගනියි. කාඩ්පත් ගිණුමේ ඇති හිඟ මුදල් අයකරගැනීම සඳහා ණය එකතුකිරීමේ තුන්වන පාර්ශ්වයක නියෝජිතයන් පත්කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ. ගෙවීම බලාත්මක කරවා ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම අවශ්‍ය වුවහොත්, හිඟ මුදල් එකතු කරගැනීමේ පිරිවැය සමග එකී නෛතික වියදම් සහ මූල්‍ය ගාස්තු කාඩ්පත් හිමියා විසින් ගෙවනු ලැබිය යුතුය.

10.8 බැංකුව විසින් තැපැල් කරන ලද ප්‍රකාශන සහ/හෝ දැන්වීම් අවස්ථාවෝචිතව, බැංකුව වෙත ආපසු ලැබෙන විටක දී මෙන් ම කාඩ්පත් හිමියා සමග සම්බන්ධ විය නොහැකිවන අවස්ථාවක දී, අයදුම්පතෙහි සඳහන් කර ඇති වෙනත් යම් ලිපිනයකට කාඩ්පත් හිමියාගේ ප්‍රකාශන සහ/හෝ දැන්වීම් නැවත යොමුකිරීමේ අයිතිය බැංකුව සතුවේ.

10.9 කාඩ්පත, කාඩ්පත් හිමියා සහ/හෝ කාඩ්පත් ගිණුම සම්බන්ධ තොරතුරු ද ඇතුළුව නමුත් ඊට සීමා නොවී, සියලු දත්ත ඕනෑම ස්ථානයක් වෙත සම්ප්‍රේෂණය කරනු සහ/හෝ ගබඩා කරනු හෝ රඳවා තබාගනු සහ බැංකුවේ බලයලත් පිරිස්, ප්‍රධාන කාර්යාලය, බැංකුවේ ශාඛා කාර්යාල සහ සෙලාන් බැන්ක් පීඑල්සී හි වෙනත් සාමාජිකයන් සහ එහි සාමාජිකයන් හෝ වෙනත් දත්ත සැකසුම් සේවා සපයන්නන් හෝ ගිණුම් ප්‍රකාශන මුද්‍රණය සහ තැපැල් කිරීම සඳහා බැංකුව විසින් සේවයේ යොදවා ඇති යම් තැනැත්තකු හෝ වෙනත් සමාන සේවා සපයන්නකු විසින් ඔවුන්ගේ අදහස අනුව පරිපාලනය සහ අභ්‍යන්තර නියාමන අවශ්‍යතා ඇතුළුව අවශ්‍ය විය හැකි ඕනෑම කාර්යයක් සඳහා ඒවාට ප්‍රවේශ වීමට සිදු වනු ඇති බවට කාඩ්පත් හිමියා එකඟ වී පිළිගනු ලබයි.

10.10 කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමට බැංකුව විසින් වැරදි ලෙස මුදල් බැරකර ඇති විටෙක, එම ඇතුළත් කිරීම ප්‍රතිශෝධනය කිරීම සඳහා සහ/හෝ එම මුදල කාඩ්පත් හිමියාගෙන් ඉල්ලා සිටීමට හෝ ඕනෑම අවස්ථාවක බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

10.11 කාඩ්පතට පූර්ව වශයෙන් මුදල් එකතු කිරීම තහනම් බවට කාඩ්පත් හිමියා තේරුම්ගෙන, බැංකුව සමග ඒ සම්බන්ධයෙන් එකඟ වන අතර, කාඩ්පත් ගිණුමෙහි බැර ශේෂයක් පවතින අවස්ථාවක දී, එවැනි බැර ශේෂයන් කාඩ්පත් හිමියා විසින් බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන, හර ශේෂයක් සහිත වෙනත් ක්‍රෙඩිට් කාඩ්පතක් වෙත පැවරීම හෝ, කාඩ්පත් හිමියාගේ ශ්‍රී ලංකා රුපියල් වලින් පවතින ඉතුරුම් ගිණුමක් වෙත හෝ ශ්‍රී ලංකා මුදලින් පවතින ජංගම ගිණුමක් වෙත පැවරීම හෝ කාඩ්පත් හිමියා නමින් අයකැමි නියෝගයක් නිකුත් කිරීම හෝ බැංකුව විසින් සිදු කරනු ඇත.

## 11. දුරකථන, ටෙලෙක්ස්, ෆැක්ස්, සහ විද්‍යුත් තැපැල් උපදෙස් සඳහා බලය ලබාදීම සහ හානිපූරණය

11.1 කාඩ්පත් හිමියා හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථනයෙන්, ටෙලෙක්ස්, ෆැක්ස්, හෝ විද්‍යුත් තැපෑල භාවිතයෙන් උපදෙස් ලබාදෙන හෝ උදෙස් ලබාදෙන බවට කියනු ලබන තැනැත්තාට බලය ලබා දුන්නේ ද නැද්ද යන්න පිළිබඳව හෝ එම තැනැත්තාගේ අනන්‍යතාව පිළිබඳව බැංකුවේ පාර්ශ්වයෙන් විමසීමක් කිරීමකින් තොරව සහ එම උපදෙස් ලැබෙන අවස්ථාවේ දී පවත්නා අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමකින් තොරව ඉහත කී පරිදි දෙනු ලබන හෝ දෙනු ලබන බවට සලකනු ලබන හෝ යම් නිවේදන, උපදෙස්, ඉල්ලා සිටීම් හෝ වෙනත් සන්නිවේදන ("උපදෙස්") ප්‍රකාරව විශ්වාසය තැබීමට සහ ඒ අනුව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා විසින් බැංකුවට අවසර දෙනු

ලැබේ. උපදෙස් ලැබෙන වේලාව/ දිනය සම්බන්ධයෙන් බැංකුවේ රීති අවසානාත්මක බවට කාඩ්පත් හිමියා පිළිගනු ලැබිය යුතුය.

11.2 කාඩ්පත් හිමියා ලබාදෙන උපදෙස් සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් අවසර ලබා දී ඇති ලෙස සහ කාඩ්පත් හිමියා විසින් එම උපදෙස් වලින් සම්පූර්ණයෙන් බැඳී සිටින බවට සැලකීමට බැංකුවට හිමිකමක් ඇති අතර, ගනුදෙනුවේ හෝ ගිවිසුමේ ස්වාභාවය පිළිබඳව හෝ සම්බන්ධිත මුදල් ප්‍රමාණය පිළිබඳව නොසලකමින් සහ උපදෙස් වල නීතිරීති වල යම් දෝෂයක්, අර්ථව්‍යාකූල බවක්, වැරදි අවබෝධයක් නොලසකමින්, උපදෙස් ලබාදී ඇත්තේ මුදල් ගෙවීමට හෝ යම් ගිණුමකට මුදල් හර කිරීමකට හෝ බැර කිරීමකට හෝ යම් මුදල් හෝ ලේඛන බැහැර කිරීමක් සම්බන්ධව හෝ වෙනත් ඕනෑම ආකාරයක ගනුදෙනුවක් හෝ වැඩපිළිවෙළක් මගින් බැංකුව සමග හෝ වෙනත් යම් තැනැත්තකු සමග කාඩ්පත් හිමියා බැඳීමකට පොරොන්දුවීමක් අදහස් කිරීම සම්බන්ධයෙන් වුවද, බැංකුව විසින් උචිත බවට සලකනු ලබන ආකාරයට උපදෙස් පිළිබඳ විශ්වාසය තබමින් සහ ඒ මත රඳා පවතිමින් යම් පියවර ගැනීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

11.3 මෙම බලය පැවරීම සහ හානිපූරණය පිළිබඳ නීතිරීති ප්‍රකාරව බැංකුව විසින් ක්‍රියා කිරීම හේතුවෙන්, උපදෙස් වලින් හෝ උපදෙස් සම්බන්ධයෙන් ඕනෑම ස්වාභාවයකින් හෝ ඕනෑම ආකාරයකින් බැංකුව විසින් දරන ලද හෝ උපචිත සියලු පාඩු, හිමිකම්, ක්‍රියාමාර්ග, නඩු කටයුතු, ඉල්ලා සිටීම්, අලාභ හානි, පිරිවැය සහ වියදම් බැංකුවට හානිපූරණය කරනු ලබන බවටත් ඒවාට එරෙහිව බැංකුව හානිපූරණය කර තබන බවටත් කාඩ්පත් හිමියා මෙයින් අවලංගු කළ නොහැකි ලෙස පොරොන්දු වී සිටිනු ලැබේ.

11.4 කාඩ්පත් හිමියාගෙන් මෙම ගිවිසුම අවසන් කිරීම පිළිබඳ නිවේදනයක් ලැබුණහොත් සහ ලැබෙන තෙක් සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සාධාරණ කාලයක් ලැබෙන තෙක් මෙම බලය ලබාදීම සහ හානිපූරණය පිළිබඳ නීතිරීති බලාත්මකව පැවතිය යුතු අතර, ඉහත කී ආකාරයට එම ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් කාඩ්පත් හිමියා විසින් දෙන ලද බලය සහ හානිපූරණය යටතේ දරන ලද යම් වගකීමකින් කාඩ්පත් හිමියා නිදහස් කිරීමක් සහ මෙම කාඩ්පත් හිමියාගේ ගිවිසුමේ නීතිරීති ප්‍රකාර ව ඉටුකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධ හානිපූරණයෙන් කාඩ්පත් හිමියා නිදහස්වීමක් නොවිය යුතුය.

## 12. නිදහස් කිරීම් සහ බැහැර කිරීම්

12.1 යම් වෙළෙඳ මහතකු හෝ ආයතනයක් විසින් කාඩ්පත ගරු කිරීම හෝ භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ කාඩ්පතේ සම්පූර්ණ සහ බලය දුන් ණය සීමාව සඳහා සහ මුදල් අත්තිකාරම්

ලබාගැනීමේ දී සම්පූර්ණ සහ බලය දුන් මුදල් අත්තිකාරම් සීමාව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

12.2 කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාවිත කරමින් ලබාගත් හෝ මිලදී ගනු ලැබූ යම් භාණ්ඩ සහ/හෝ සේවා වල යම් දෝෂයක් හෝ අඩුපාඩුවක් පිළිබඳව බැංකුව කිසිම වගකීමකට බැඳී නොසිටී. භාණ්ඩ සහ/හෝ සේවා අලෙවිය සඳහා හෝ පරිභෝජනය සඳහා ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ දැන්වීම්, පොත්, සඟරා, වාරසඟරා, තැපැල් ඇණවුම් ආකෘතිපත්‍ර, අත්පොත් හෝ වෙනත් යම් ලේඛන වල සඳහන් හෝ අන්තර්ගත ප්‍රකාශ, වචන, පින්තූර, හෝ වෙනත් නියෝජන සඳහා බැංකුව වගකියනු නොලැබේ. වෙළෙඳ මහතුන්ට එරෙහිව වූ පැමිණිලි වෙළඳ ආයතනය සමග කාඩ්පත් හිමියා විසින් විසඳා ගනු ලැබිය යුතු අතර, වෙළෙඳ ආයතනයට එරෙහිව කාඩ්පත් හිමියා විසින් කරනු ලබන කිසිදු හිමිකම්පෑමක් සඳහා වූ වගකීමෙන් කාඩ්පත් හිමියා විසින් මෙම ගිවිසුම යටතේ බැංකුව නිදහස් කර තැබිය යුතුය.

12.3 බැංකුවේ පාලනයෙන් බැහැර පවතින හෝ එසේ නොවන හෝ වෙනත් යම් ආකාරයකින් හෝ, ඕනෑම ATM යන්ත්‍රයක හෝ සන්නිවේදන පද්ධතියක හෝ පහසුකම් වල හෝ දත්ත සැකසුම් පද්ධතියක හෝ සම්ප්‍රේෂණ සම්බන්ධතාවක හෝ වෙනත් කාර්මික හෝ වෙනත් මතභේදයක් හෝ සිදුවන යම් බාධාවක් හෝ බිඳවැටීමක් හෝ දෝෂයක් හේතුවෙන් පැන නගින කවර ආකාරයේ අපහසුතාවක්, පාඩුවක්. අලාභයක් හෝ කවරාකාර ස්වාභාවයක වුව දුෂ්කරතාවක් සඳහා බැංකුව කිසිම ආකාරයෙන් කාඩ්පත් හිමියා හට වගකියනු නොලැබේ.

12.4 බැංකුව විසින් සෑම මාසයකම එක් දිනයක්, ප්‍රකාශන දිනය සහ ගෙවීම් නියමිත දිනය ලෙස තෝරාගනු ලැබිය හැකිය. බැංකුව විසින් කාඩ්පත් හිමියාට මාසික පදනම මත ප්‍රකාශනයක් යැවීමට අපොහොසත් වුවද, ගෙවීමට නියමිත මූල්‍ය ගාස්තු ද ඇතුළුව ගෙවීම් නොපමාව සිදුකිරීම සම්බන්ධයෙන් වන කාඩ්පත් හිමියාගේ වගකීම දිගටම ක්‍රියාත්මක විය යුතුය.

12.5 කාඩ්පතෙහි අඩංගු කරන ලද හෝ කේත කරන ලද යම් මුද්‍රිත හෝ වෙනත් ප්‍රතිඋත්පාදිත සංකේතයක් දරන, නිසි ලෙස සම්පූර්ණ කරන ලද යම් අලෙවි වවුචරයක්, ගනුදෙනුවක්, වාර්තාවක්, ණය වවුචරයක්, මුදල් වැයකිරීම් අණකරයක් සහ/හෝ වෙනත් යම් ගාස්තුවක් සඳහා ගෙවීම් කිරීමට බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

12.6 සියලු ගනුදෙනු පිළිබඳ කාඩ්පත් ගිණුමේ සඳහන් බැංකු වාර්තා, අලෙවි රිසිට්පත් සහ ගිණුම් ප්‍රකාශන, සියලු කාර්යය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා පිළිබඳ තීරණාත්මක සහ බැඳීම් සහගත කරුණක් බවට කාඩ්පත් හිමියා පිළිගෙන සිටියි.

12.7 බැංකුවේ අත්පොත්, ප්‍රකාශන හෝ පළකිරීම් වල සඳහන් වෙළෙඳ දැන්වීම්කරුවන් විසින් සපයනු ලබන සේවා, සැලසුම් හෝ ප්‍රතිලාභ වල යම් පැහැර හැරීමක් හෝ අනිසි ප්‍රතිඵලයක් හේතුවෙන් උපචිත වන කිසිම ආකාරයක හිමිකම් පෑමක් සඳහා බැංකුව කිසිදු අයුරකින් වගකීමට බැඳී නොමැත.

12.8 කාඩ්පත් ගිණුමේ ශේෂය මගින් ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව තිබුණ ද, එය නොසලකා බැංකුව විසින් උචිත බවට සලකනු ලබයි නම්, ඕනෑම ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ අයිතිය බැංකුව රඳවා ගනියි.

12.9 නැවත නැවත සිදුවන (ප්‍රත්‍යාවර්තන) ගනුදෙනු සම්බන්ධයෙන් වනවිට, කාඩ්පත් ගිණුමට ගනුදෙනු හරවීම වැළැක්වීම සඳහා කාඩ්පත් හිමියා විසින් වෙළෙඳ මහතාගේ අලුත් කිරීමේ ප්‍රතිපත්ති අවලංගු කිරීම සහ/හෝ වෙළෙඳ මහතාගේ අලුත්කිරීමේ ප්‍රතිපත්ති අනුව ක්‍රියා කිරීම හෝ කළ යුතුය. වෙළෙඳ මහතාගේ අලුත්කිරීමේ ප්‍රතිපත්ති අවලංගු කිරීමට සහ/හෝ එම වෙළෙඳ මහතාගේ අලුත්කිරීමේ ප්‍රතිපත්ති වලට එකඟව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත්වීම සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ.

12.10 බාධාවකින් තොරව ගනුදෙනු ප්‍රත්‍යාවර්තනය/නිත්‍ය උපදෙස් අඛණ්ඩව සිදුකරගෙන යාම සහතික කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් වෙළෙඳ මහතුන්/ආයතන වෙත සපයන ලද කාඩ්පත් හිමියාට අදාළ ක්‍රෙඩිට් කාඩ්පත් අංකය, අවලංගු වන දිනය, පුද්ගලික තොරතුරු ආදිය ඇතුළු සියලු විස්තර සම්බන්ධයෙන් කිසියම් වෙනසක් ඇති වුවහොත් ඒ බව කාඩ්පත් හිමියා විසින් අදාළ වෙළෙඳ මහතුන්/ආයතන වෙත ලබාදිය යුතු වේ. ඉහත සඳහන් පරිදි වෙළෙඳ මහතුන්/ආයතන යාවත්කාලීන කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධ කිසිදු අනිසි ප්‍රතිඵලයක් හේතුවෙන් උපචිත වන කිසිම ආකාරයක හිමිකම්පෑමක් සඳහා බැංකුව කිසිදු අයුරකින් වගකීමට බැඳී නොමැත.

## 13. නෛතික පියවර

ඕනෑම හේතුවක් නිසා, කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුමේ නීතිරීති සහ කොන්දේසි වලට එකඟව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, එවිට බැංකුව විසින් මෙම කාඩ්පත් ගිවිසුම අවසන් කර, ඒ යටතේ ගෙවීමට ඇති සියලු මුදල් අය කරගැනීම සඳහා නඩු පවරනු ලැබිය හැකිය. සම්පූර්ණ හානිපූරණ පදනමකින් නීති ගාස්තු ද ඇතුළුව බැංකුව විසින් දරන ලද සියලු පිරිවැය, ගාස්තු සහ වියදම් සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය.

## 14. විනිමය පාලන නියෝග

14.1 විනිමය පාලන පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව සහ ඒ යටතේ වන වෙනත් නියාමන ආයතන ("විනිමය පාලන පනත") වල විධාන, රෙගුලාසි, මෙහෙයුම් උපදෙස් අනුව, කාඩ්පත් හිමියා විසින් සියලු අවස්ථාවල දී කාඩ්පත භාවිත කරනු ලබන බවට, ඔහු/ඇය සහතික වේ.

14.2 ගමනාගමනය, නවාතැන්, වෛද්‍ය, ජීවන වියදම්, ලියාපදිංචි ගාස්තු ගෙවීම, විදේශ ආයතනකට හෝ අධ්‍යයන ආයතනයකට ගෙවිය යුතු පුද්ගලික ස්වාභාවයේ ගාස්තු සහ වාර්ෂික දායක මුදල්, විදේශයක දී පුද්ගලික භාවිතය සඳහා භාණ්ඩ මිල දී ගැනීම් සඳහා ගෙවීම්, පුද්ගලික ස්වභාවයේ ගමනාගමන සහ සෞඛ්‍ය, රක්ෂණය සඳහා පමණක් රක්ෂණ වාරික සහ/හෝ සංචාරක වියදම්, හෝටල් ගාස්තු, ආනුශාංගික වියදම්, වෛද්‍ය වියදම් සහ පුද්ගලික භාවිතය සඳහා භාණ්ඩ මිල දී ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් මගින් බිල්පත් කරන ලද විද්‍යුත් තැපැල්, අන්තර්ජාල, දුරකථන හරහා සකසන ලද ගනුදෙනු හා සම්බන්ධිත පුද්ගලික කටයුතු සඳහා පමණක් ගෙවීම් කිරීමට විදේශයන් හි දී කාඩ්පත් හිමියා විසින් කාඩ්පත භාවිත කරනු ලැබිය යුතුය. ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වූ ගෙවීම් කිරීමට කාඩ්පත් භාවිත නොකළ යුතුය.

14.3 ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ගෙවීම් කිරීමට, විදේශ විනිමය ගනුදෙනු (Forex වෙළෙඳ ගනුදෙනු) සඳහා, අතථ්‍ය ව්‍යවහාර මුදල් ගනුදෙනු ආශ්‍රිත ගෙවීම්, ඔට්ටු ඇල්ලීම්, ශ්‍රී ලංකාවෙන් බැහැරව මුදල් ගනුදෙනු මත සිදුකරන ක්‍රීඩා සහ සූදු ක්‍රියාකාරකම් සහ වාණිජ ප්‍රමාණයන්ගෙන් ආනයනය කළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වූ ගෙවීම් කිරීමට කාඩ්පත් භාවිත නොකළ යුතුය. බඩුබාහිරාදිය තොගයක් සඳහා පිරිවැය රක්ෂණ ගාස්තු පදනම මත (C.I.F.) කලින් කලට නියාමක විසින් ප්‍රකාශ කරනු ලබන උපරිමයක් දක්වා පුද්ගලික භාවිතය සඳහා භාණ්ඩ ආනයනය සඳහා කරනු ලබන ගෙවීම් සීමා කරනු ලැබේ. "පුද්ගලික භාවිතය" යන්නෙන් කාඩ්පත දරන්නා වන කාඩ්පත් හිමියා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා, ළමුන් සහ දෙමාපියන් සඳහා කාඩ්පත භාවිතය අදහස් වන අතර, යම් වාණිජ අරමුණු සඳහා කාඩ්පත භාවිතය ඊට ඇතුළත් නොවේ.

14.4 ශ්‍රී ලංකා රුපියල්, විදේශ ව්‍යවහාර මුදලක් බවට පරිවර්තනය කරනු ලබන්නා වූ ඉහත කී ආකාරයට ශ්‍රී ලංකාවේ සිට විදේශයක යම් ගනුදෙනුවක් සිදු කිරීම සඳහා කාඩ්පත් හිමියාගේ කාඩ්පත, ඔහු/ඇය වෙනුවෙන්, වෙනත් කිසියම් පාර්ශ්වයක් විසින් භාවිත කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් අවසර නොදිය යුතුය.

14.5 කාඩ්පත් හිමියා සංක්‍රමණය වන අවස්ථාවක දී, විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන අවස්ථාවක දී හෝ දැනට බලාත්මකව පවත්නා සහ කලින් කල සංශෝධනය කරනු ලබන විනිමය පාලන පනතේ අර්ථනිරූපණයන්ට අනුව, BFCAs, PFCAs DFCAs, DRAs, IIAs, ERIAs වලට

එරෙහිව–විදේශ විනිමය වලින් ගෙවීම් පියවීම සඳහා නිකුත් කර ඇති ඉලෙක්ට්‍රොනික මුදල් පැවරුම් කාඩ්පත් හෝ අන්තර්ජාල සම්ප්‍රේෂණ හරහා හිග මුදල් පියවීමේ පදනම මත හැරෙන්නට, කාඩ්පත් හිමියා විසින් ස්වකීය කාඩ්පත (කාඩ්පත්) බැංකුව වෙත භාරදිය යුතුය. විදේශ විනිමය පනත, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත සහ එහි වන නීති, මාර්ගෝපදේශ හා විධානයන්, මූල්‍ය මණ්ඩලය විසින් දක්වා ඇති උපදෙස් යටතේ වන විධිවිධානයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය වෙනත් ඕනෑම නියාමන අධිකාරියක් විසින් නිකුත් කර කලින් කලට දක්වනු ඇති ආශ්‍රිත මාර්ගෝපදේශ සහ විධානයන් සමග 1988 අංක 30 දරන බැංකුකරණ පනත යටතේ දක්වා ඇති වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුකූලව බැංකුව කටයුතු කරනු ඇත.

14.6 කාඩ්පත හරහා මුදල් අත්තිකාරම් ආකාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් ආපසු ගැනීම සම්බන්ධයෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 03 හි විධාන යටතේ අවසර දී ඇති ගනුදෙනු සඳහා එවැනි ව්‍යවහාර මුදල් වර්ග භාවිත කර ඇති බවට වන ව්‍යවස්ථාපිත වාර්තා තබාගැනීමේ අවශ්‍යතාව දක්වා, කාඩ්පත් හිමියා විසින් ඒ පිළිබඳ සාක්ෂි ළඟ තබාගත යුතු වේ.

14.7 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 03 දරන ශ්‍රී ලංකා මහ බැංකු විධාන වල විෂයපථය යටතේ වන ඕනෑම අරමුණක් උදෙසා, ඉලෙක්ට්‍රොනික අරමුදල් පැවරුම් කාඩ්පත හරහා ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික පුද්ගලයෙකු වෙත යම් ගෙවීමක් සිදු කිරීමේ දී, කාඩ්පත් හිමියා විසින් අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙතින් ඒ සඳහා පූර්ව ලිඛිත අවසරයක් ලබාගත යුතු වේ.

14.8 ක්‍රෙඩිට් කාඩ්පත මගින් විදේශ විනිමය වලින් සිදු කළ ගෙවීම් /මුදල් ආපසු ගැනීම් අත්හිටුවීම සඳහා නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ සහ වහා ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය බැංකුව රඳවා ගන්නා අතර, ඉහත කී විධානයන් යටතේ අවසර ලබා දී නොමැති අරමුණු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් ගෙවීම් / මුදල් ආපසු ගැනීම් සිදුකරන බවට සැක කිරීමේ සාධාරණ හේතු පවතියි නම්, එකී කරුණ අධ්‍යක්ෂ - විනිමය පාලන දෙපාර්තමේන්තුවෙහි අවධානයට යොමු කිරීම ද සිදු කරනු ඇත.

14.9 මූලික කාඩ්පත් හිමියන් ද ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයන් නොවේ නම් මිස, ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයන් වන පුද්ගලයන් හට පරිපූරක/අතිරේක ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් නොකිරීමේ අයිතිය බැංකුව රඳවා ගන්නා අතර, පරිපූරක/අතිරේක කාඩ්පත් නිකුත් කිරීම සහ භාවිතය, ඉහත විධානයන් යටතේ දැක්වෙන නීතිරීති සහ කොන්දේසි වලට යටත් වේ.

14.10 යම් අවස්ථාවක බලාත්මකව පවත්නා විනිමය පාලන නියෝග උල්ලංඝනය කර ඇති බවට විශ්වාස කිරීම සඳහා ඕනෑම ආකාරයක හේතුවක් පවතින අවස්ථාවක දී කාඩ්පත් හිමියාට (කාඩ්පත්

හිමියන්ට) දැනුම්දීමකින් තොරව ස්වකීය අභිමතය පරිදි කාඩ්පත (කාඩ්පත්) අවලංගු කිරීම බැංකුව විසින් කරනු ලැබිය හැකිය.

**15. නීතිරීති වෙනස්වීම**

15.1 සුදුසු යැයි හැඟෙන ඕනෑම ආකාරයකින් කාඩ්පත් හිමියා වෙත දැනුම්දීම මගින් කලින් කලට මෙහි අන්තර්ගත නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීම සඳහා හෝ අලුත් නීතිරීති සහ කොන්දේසි (බැංකුවට සුදුසු යැයි හැඟෙන ස්ථානයන් හි එකී වෙනස්කම් පළ කිරීම ද ඇතුළුව නමුත් ඊට සීමා නොවී) හඳුන්වාදීම සඳහා (මේ යටතේ පනවන ලද ගාස්තු සහ අය කිරීම් ප්‍රතිශෝධනය කිරීම හෝ අලුත් ගාස්තු සහ අය කිරීම් හඳුන්වාදීම යනාදියට සීමා නොවන්නා වූ දේ ද ඇතුළුව) බැංකුව විසින් අයිතිය තබා ගනු ලැබේ. ඉහත කී එක් ආකාරයකින් හෝ සියලු ආකාරවලින් එම වෙනස් කිරීම බලාත්මක වන්නා වූ එකී දිනයෙන් පසුව කාඩ්පත භාවිත කිරීම මගින් එම වෙනස් කිරීම වෙන්කර තැබීමකින් තොරව කාඩ්පත් හිමියා විසින් පිළිගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියා විසින් එම වෙනස්කිරීම/ සංශෝධනය පිළිගනු නොලබයි නම්, එම වෙනස් කිරීම/සංශෝධනය බලාත්මකවන දිනයට පෙරාතුව යම් අතිරේක කාඩ්පත (කාඩ්පත්) / පරිපූරක කාඩ්පත (කාඩ්පත්) ද සමග කාඩ්පත් හිමියා විසින් ස්වකීය කාඩ්පත අවලංගු කිරීම සඳහා බැංකුව වෙත භාරදිය යුතුය.

15.2 කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ කාඩ්පත් සහ වෙනත් ඕනෑම අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) සම්බන්ධ ගනුදෙනු වලට එරෙහිව යම් පාඩු, හිමිකම් පෑම්, ක්‍රියාමාර්ග, නඩුකටයුතු, ඉල්ලීම්, හානි, පිරිවැය සහ වියදම් වලට එරෙහිව අවලංගු කළ නොහැකි අයුරින් බැංකුව (මෙම ගිවිසුම අවසන් කළ ද එය නොසලකමින්) හානිපූරණය කළ යුතු වේ.

**16. තොරතුරු හෙළිදරව් කිරීම**

16.1 බැංකුව විසින් බලය පවරා ඇති ඕනෑම තුන්වන පාර්ශ්වයකට, රජයේ ආයතනයකට සහ/හෝ බැංකුව විසින් උචිත බවට සලකනු ලබන නියාමකයන්ට කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන්) සම්බන්ධයෙන් හෝ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ කාඩ්පත් ගිණුම (ගිණුම්) හා සම්බන්ධයෙන් වූ තොරතුරු හෙළිදරව් කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුවට බලය පවරා දෙනු ලැබේ. කාඩ්පත් හිමියා, බැංකුව සමග පවත්වාගෙන යනු ලබන කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම අවසන් කිරීමෙන් පසුව වුවද මෙම කැමැත්ත ලබාදීම බලාත්මක වන්නේ ය.

16.2 කාඩ්පත භාවිත කිරීම සහ කාඩ්පත් ගිණුම පිළිබඳව කාඩ්පත් හිමියන්ගේ වාර්තා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය සහ/හෝ දේශීය හෝ විදේශීය, වෙනත් යම් ණය තොරතුරු

කාර්යාංශයක් වෙත වාර්තා කිරීමට ස්වකීය අභිමතය පරිදි බැංකුවට හිමිකමක් ඇති බවට කාඩ්පත් හිමියා මෙයින් කැමැත්ත ලබාදී පිළිගෙන සිටියි.

## 17. හිලව් කිරීමේ අයිතිය

හිලව් කිරීමේ යම් සාමාන්‍ය අයිතිවාසිකම්වලට හෝ නීතිය මගින් හෝ බැංකුවෙහි වෙනත් යම් ගිවිසුමක්, ලිපියක් හෝ වෙනත් ඕනෑම ලේඛනයක් යටතේ මගින් පවරා ඇති වෙනත් අයිතිවාසිකම් වලට අමතරව, දැනුම්දීමකින් තොරව, කාඩ්පත් හිමියා සහ/හෝ අතිරේක/පරිපූරක කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන් විසින්) බැංකුව සමග පවත්වාගෙන යනු ලබන වෙනත් යම් ගිණුමක් (ගිණුම්) සමග කාඩ්පත් හිමියාගේ/කාඩ්පත් හිමියන්ගේ කාඩ්පත් ගිණුමේ සහ/හෝ අතිරේක/පරිපූරක කාඩ්පත් ගිණුමේ (ගිණුම් වල) පවත්නා හිඟ ශේෂය එකතු කිරීම හෝ ඒකාබද්ධ කිරීම සහ එවැනි යම් ගිණුමක (ගිණුම්වල) බැරට පවතින මුදල් හිලව් කිරීමට හෝ පැවරීමට හෝ මෙම කාඩ්පත් ගිවිසුම යටතේ කාඩ්පත් හිමියා විසින් බැංකුව කෙරෙහි ඇති වගකීම සපුරාලීම සඳහා යොදා ගැනීම බැංකුව විසින් කරනු ලැබිය හැකිය.

## 18. සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහන

18.1 Rewards ලකුණු උපයා ගැනීම

(a) **"සෙලාන් කාඩ්පත් Rewards"** යනු Rewards ලකුණු වැඩසටහනේ ප්‍රධාන මිනුම් ඒකකයයි.

(b) බැංකුව විසින් ශ්‍රී ලංකාවේ දී නිකුත් කරන ලද Visa Platinum, Visa Signature, MasterCard World සහ Visa Infinite Cards මෙම Rewards ලකුණු වැඩසටහන සඳහා සහභාගි වීමට සුදුසුකම් ලබයි. තනි පුද්ගල සහ ආයතනික කාඩ්පත් යන දෙවර්ගයම මීට ඇතුළත් වේ.

(c) ක්‍රෙඩිට් කාඩ්පත පිළිගනු ලබන දේශීය හෝ විදේශීය ස්ථානයක දී සහ ඔන්ලයින් මගින් මිල දී ගැනීම් සඳහා සිය කාඩ්පත භාවිතයෙන් Visa Platinum කාඩ්පත් හිමියකු විසින් වැය කරනු ලබන සෑම රු.300/- සඳහා ම 1 ලකුණක් බැගින් ද, Visa Signature, MasterCard World සහ Visa Infinite කාඩ්පත් හිමියන් විසින් වැය කරනු ලබන සෑම රු.100/- සඳහා ම 1 ලකුණක් බැගින් ද හිමි කරගනු ඇත. Rewards ලකුණු පිරිනමනු ලබන්නේ රු.1,000 ඉක්මවූ ගනුදෙනු සඳහා පමණි. රු. 1,000 ට අඩු ගනුදෙනු සඳහා ලකුණු පිරිනමනු නොලබයි.

(d) කැසිනෝ, විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්, ශේෂ පැවරීම්, මුදල් වාරික සැලසුම යටතේ කෙරෙන මුදල් ආපසු ගැනීම්, වාර්ෂික ගාස්තු සහ වෙනත් ගාස්තු, මූල්‍ය අය කිරීම් සහ වෙනත් අය කිරීම්, පෙන්නුම් නොකළ හෝ අවලංගු කළ ගනුදෙනු ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, මුදල් අත්තිකාරම්, අර්ධ මුදල් ගනුදෙනු (quasi cash transaction) සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් Rewards ලකුණු උපයනු නොලබයි.

(e) සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහන වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වන අතර, වෙනසක් සිදුකිරීමෙන් පසුව, ඒ පිළිබඳව විද්‍යුත් තැපැල් හෝ ප්‍රකාශන පණිවුඩ මගින් හෝ ප්‍රකාශන මත අලවන ලද පණිවුඩ මගින් (ස්ටිකර් මගින්) හෝ කෙටි පණිවුඩ සේවා මගින් හෝ ප්‍රකාශන ලිපි කවරය මත හෝ මුද්‍රිත දැන්වීමක් හෝ බැංකුවේ නිල පොදු වෙබ් අඩවිය වන www.seylan.lk හරහා පණිවුඩයක් මගින් හෝ කාඩ්පත් හිමියන් වෙත දැනුම් දෙනු ලැබේ.

(f) මූලික සහ පරිපූරක යන කාඩ්පත් දෙක ම සම්බන්ධයෙන් Rewards ලකුණු උපචිත වන අතර, පවත්නා සමස්ත Rewards ලකුණු ප්‍රමාණය පිරිමුදවීමට සුදුසුකම් ලබන්නේ මූලික කාඩ්පත් හිමියා පමණි.

(g) කාඩ්පත් හිමියා සඳහා වන වාරික සැලසුම හෝ 0% වාරික සැලසුම හරහා සිදුකරන ලද ඕනෑම ගනුදෙනුවක් සඳහා Rewards ලකුණු පිරිනමනු ලබන්නේ සැලසුමෙහි කාලසීමාව තුළ මාසික වාරිකය සඳහා පමණක් වන අතර, සමස්ත ගනුදෙනු වටිනාකම උදෙසා නොවේ.

(h) 2023 මැයි 02 දින සිට සිදු කළ POS (ගෙවීම් ස්ථානයන් හි දී සිදු කළ) ගනුදෙනු සඳහා Rewards ලකුණු පිරිනමනු ඇත.

18.2 සෙලාන් කාඩ්පත් Rewards ලකුණු පිරිමුදවීම

(i) උපයන ලද Rewards ලකුණු පිරිමුදවා ගැනීම සඳහා කාඩ්පත් හිමියන් හට පහත විකල්ප අතරින් එකක් භාවිත කළ හැකිය:

- සෙලාන් කාඩ්පත් Rewards ද්වාරය (portal) හරහා ලකුණු පිරිමුදවීම මගින්;
- Rewards හවුල්කාරිත්ව ආයතනවල දී ලකුණු පිරිමුදවීම මගින්;

(ii) Rewards හවුල්කාරිත්ව ආයතන වෙතින් ලකුණු පිරිමුදවීම, මූලික වශයෙන් සිදු කරනු ලබන්නේ ස්වයංක්‍රීයවම Rewards ලකුණු පිරිමුදවීමට ඉඩ ලැබෙන පරිදි, ගනුදෙනුකරුගේ ලියාපදිංචි ජංගම දුරකථනය අංකය ලබාදීම මගිනි. පිරිමුදවන ලද Rewards ලකුණු වල මූල්‍ය වටිනාකම, එම Rewards හවුල්කාරිත්ව ආයතනවල දී මිලදී ගනු ලැබූ අයිතමයේ මිල ගණනින් අඩු කරනු ලැබේ.

(iii) කාඩ්පත් හිමියා විසින් ලකුණු පිරිමුදවන ලෙස ඉල්ලා සිටීමෙන් පසුව, පිරිමුදවන ලද Rewards ලකුණු කාඩ්පත් හිමියාගේ අදාළ Rewards ලකුණු හිමිකාරීත්ව වාර්තාවෙන් කපාහැර දැමීම/ඉවත් කිරීම කරනු ලැබේ.

(iv) පිරිමුදවීම සඳහා ඉල්ලුම් කිරීමෙන් සහ එම ඉල්ලීම් සකස් කිරීමෙන් පසුව, එම ඉල්ලීම් අවලංගු කිරීම හෝ වෙනස් කිරීම සිදුකරනු නොලැබේ.

(v) උපයා ගත් Rewards ලකුණු, මුදල් බවට හැරවිය නොහැකි අතර, බැර වශයෙන් නැවතත් කාඩ්පත වෙත පැවරීම ද කළ නොහැක.

(vi) පැහැරහැරීම් නොකරන ලද කාඩ්පත් හිමියන් විසින් පමණක් Rewards ලකුණු පිරිමුදවීම කළ හැකිය.

(vii) ක්‍රෙඩිට් කාඩ්පත මත ගෙවීමට නියමිතව ඇති හිඟ ශේෂය පියවීම සඳහා Rewards ලකුණු වල වටිනාකම භාවිත කළ නොහැකිය.

18.3 Rewards හවුල්කාරිත්ව ආයතන

(a) ලකුණු පිරිමුදවන විට, අතිරේක වටිනාකම් හෝ අතිරේක වට්ටම් පිරිනැමීම සඳහා ඇතැම් Rewards ලකුණු හවුල්කාරිත්ව ආයතන තෝරාගනු ලැබිය හැකිය. ඕනෑම හේතුවක් නිසා මෙම වට්ටම් හෝ අතිරේක වටිනාකම් සැපයීම සඳහා යම් Rewards ලකුණු හවුල්කාරිත්ව ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ.

(b) බැංකුව, යම් Rewards ලකුණු හවුල්කාරිත්ව ආයතනයක දී පිරිමුදවනු ලබන යම් නිෂ්පාදන හෝ සේවා සපයන්නකු නොවන අතර, ඒ සම්බන්ධ කිසිම වගකීමක් භාරගනු නොලැබේ.

(c) ස්වකීය අභිමතය පරිදි වෙනත් යම් loyalty/rewards/mileage වැඩසටහනක් ඒකාබද්ධ කිරීමට හෝ පවතින වැඩසටහනක් නවතා දැමීමට හෝ බැංකුව අයිතිය රඳවා ගනියි.

18.4 Rewards ලකුණු පිළිබඳ විමසීම්

(a) ආරම්භක ශේෂය, උපචිත ලකුණු, යථාවත් කළ ලකුණු, පිරිමුදවන ලද ලකුණු, ලකුණුවල ශේෂය සහ කල් ඉකුත්වීමට නියමිත-ලකුණු පිළිබඳ විස්තර සෙලාන් Rewards ලකුණු සාරාංශය යටතේ කාඩ්පත් හිමියාගේ ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇත (කාලසීමාව සඳහා).

18.5 Rewards කල් ඉකුත්වීම

(a) යම් නිශ්චිත වර්ෂයක දී උපයාගනු ලබන Rewards ලකුණු ඒකක අවුරුදු තුනකට පසුව, තෙවැනි වසරේ දෙසැම්බර් මස 31 දින දී කල් ඉකුත් වේ.

(b) ආපසු දෙන ලද ලකුණු, ආපසු දුන් දිනයේ සිට දින 30ක ට පසුව කල් ඉකුත් වනු ඇත.

(c) කල් ඉකුත්වීමට නියමිත සහ පිරිමුදවා නොගත් සියලු ලකුණු, Rewards ලකුණු කල් ඉකුත්වීමෙන් පසුව කාඩ්පත් හිමියාට නොලැබෙනු ඇත.

18.6 සෙලාන් කාඩ්පත් Rewards ලකුණු සඳහා අදාළ වන පොදු නීතිරීති

(a) Rewards ලකුණු උපයා ගැනීම සහ එකතුකර ගැනීම සම්බන්ධ වංචා සහ/හෝ ඒ සඳහා උත්සාහ කිරීම හෝ එසේ වංචා සහගත ලෙස පිරිමුදවා ගැනීමේ නියෝග හේතුවෙන් බැංකුව විසින් කාඩ්පත ආපසු ලබාගැනීම/අවලංගු කිරීමට අමතරව, එසේ උපචිත කරගනු ලැබූ Rewards ලකුණු තහනම් කිරීම සඳහා එය හේතු විය හැකිය.

(b) ඕනෑම හේතුවක් නිසා යම් නිශ්චිත ගනුදෙනුවක් පිළිබඳ හබකර සිටින හෝ ආපසු අය කරගනු ලබන හෝ ආපසු හරවා යවනු ලබන අවස්ථාවක දී, එවැනි ගනුදෙනු මගින් උපචිත වන Rewards ලකුණු බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් නිශ්චිත ගනුදෙනුවක් සිදුවී Rewards ලකුණු පිරිමුදවාගෙන ඇති අවස්ථාවක දී, ඉන් පසුව හබකර සිටීමක් සිදු වී/ගනුදෙනු ප්‍රතිශෝධනයක් සිදු කිරීමට අවශ්‍යව ඇති අවස්ථාවක දී, පිළිවෙලින් වූ කාඩ්පත් හිමියාගෙන් කාඩ්පත සඳහා අය කිරීම මගින් හෝ බැංකුව සමග පවත්නා වෙනත් ගිණුමකින් අය කරගැනීම මගින් හෝ එම ගනුදෙනු සම්බන්ධයෙන් පිරිමුදවා ගන්නා ලද හබකර සිටින Rewards ලකුණු වලට සමාන රුපියල් අගයක් අය කරගැනීමේ අයිතිය බැංකුව විසින් තබාගනු ලැබේ. හිමිකම් පෑමක් ලබා දී ඇති එවැනි අවස්ථාවක දී, කාඩ්පත් හිමියාගේ ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලබන ඉදිරි ගෙවීම් කළ යුතු දිනයේ දී එම මුදල පියවීම සඳහා කාඩ්පත් හිමියා එකඟ වේ.

(c) කාඩ්පත් හිමියා විසින් ඔහුගේ කාඩ්පත් ගිණුම සිය කැමැත්තෙන් අවසන් කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, හෝ ඕනෑම අවස්ථාවක දී ඕනෑම හේතුවක් මත සෙලාන් බැංකුව විසින් ඔහුගේ කාඩ්පත අවසන් කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, මූලික කාඩ්පත් හිමියා සහ පරිපූරක කාඩ්පත් හිමියා යන දෙදෙනාම Rewards වැඩසටහනට සහභාගි වීමට සුදුසුකම් නොලබනු ඇත. කාඩ්පත් ගිණුමක් අවසන් කිරීමේ දී, භාවිත නොකළ Rewards ලකුණු ස්වයංක්‍රීයව ම අවලංගු වන අතර, කාඩ්පත් හිමියා හට එකී Rewards ලකුණු පිරිමුදවීමට නොහැකි වේ. භාවිත නොකළ Rewards ලකුණු කාඩ්පත් හිමියාගේ වෙනත් කිසිදු කාඩ්පත් ගිණුමක් වෙත පැවරීම සිදු කළ නොහැකි වේ.

(d) ඕනෑම අවස්ථාවක දී ඕනෑම හේතුවක් මත අතිරේක කාඩ්පත් හිමියෙකුගේ ගිණුමක් අවසන් කළ ද, සෙලාන් බැංකුව විසින් අන්‍යාකාර තීරණයකට එළඹ නොමැති නම්, මූලික කාඩ්පත් හිමියා හට අඛණ්ඩව සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහනට සහභාගි විය හැකි වේ.

(e) සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහන සම්බන්ධයෙන් මෙම වගන්තියෙහි වන නීතිරීති සහ කොන්දේසි ඇතුළුව Rewards ලකුණු හවුල්කාරිත්ව ආයතන පිළිබඳ යම් වෙනස් කිරීම් සඳහා සහ එකී වෙනස් කිරීම් පිළිබඳව කාඩ්පත් හිමියා වෙත ප්‍රකාශනය සමග පණිවුඩ හෝ ප්‍රකාශනය සමග ඇමුණුම්/බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය/ කෙටි පණිවුඩ සේවාව හෝ වෙනත් ඕනෑම සුදුසු සන්නිවේදන මාධ්‍ය මගින් දැනුම්දීම සඳහා බැංකුව විසින් අයිතිය රඳවා ගනු ලැබේ.

(f) සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහන පිළිබඳ යම් මතභේදයක් ඇති පැන නැගුන අවස්ථාවක දී, බැංකුවෙහි තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වේ.

(g) සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහන හා සම්බන්ධ කෙරෙන විශේෂ පිරිනැමීම් පිළිබඳව සන්නිවේදන කිරීමට භාවිත කෙරෙනු ඇති දැන්වීම් කලින් කලට ලැබීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

(h) උපදෙස් ලබාදෙන බවට සලකනු ලබන තැනැත්තාගේ අධිකාරී බලය හෝ අනන්‍යතාව පිළිබඳව බැංකුව පාර්ශ්වයෙන් කිසිදු විමසීමකින් තොරව සහ උපදෙස් ලැබෙන අවස්ථාවේ පවතින අවස්ථානුගත කරුණු පිළිබඳ නොසලකමින්, කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තා විසින් ("උපදෙස්" යනුවෙන් හඳුන්වනු ලබන) දුරකථනය මගින්, කෙටි පණිවුඩ සේවය ("SMS"), පුද්ගල අන්තර්ජාල බැංකුකරණ සේවය ("PIB") හෝ විද්‍යුත් තැපැල මගින් ලබාදෙන Rewards ලකුණු පිරිමුදවීම සම්බන්ධයෙන් වූ යම් නිවේදන, උපදෙස්, ඉල්ලා සිටීම් හෝ වෙනත් සන්නිවේදන පිළිබඳ විශ්වාසය තැබීම සහ ඒ අනුව ක්‍රියා කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත බලය දෙනු ලැබේ.

(i) එකම කාඩ්පත් හිමියා හට හෝ වෙනස් වූ කාඩ්පත් හිමියන් හට අයත් විවිධ ක්‍රෙඩිට් කාඩ්පත් අතර Rewards ලකුණු රැස්කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

(j) බැංකුව විසින් පත් කරන ලද තෙවැනි පාර්ශ්වයක් සමග සෙලාන් කාඩ්පත් Rewards ලකුණු ගණනය කිරීම පිණිස, ගනුදෙනු ආශ්‍රිත දත්ත ගබඩා කර තබා ගැනීමට බැංකුව වෙත කාඩ්පත් හිමියා විසින් බලය ලබා දේ.

(k) අඛණ්ඩව මාස දෙක (02)ක් සඳහා කාඩ්පත් හිමියා විසින් අවම ගෙවීම සිදු නොකර සිටින අවස්ථාවක දී, එසේ ගෙවීම් හිඟව පවතින දිනය වනවිට උපයාගෙන ඇති Rewards ලකුණු අවලංගු කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනියි.

(l) උපයාගෙන ඇති, පිරිමුදවා ගෙන ඇති සහ එක්රැස් කරගෙන ඇති Rewards ලකුණු පිළිබඳ ඇතිවන යම් මතභේද, බැංකුව විසින් විමර්ශනය කරනු ලබන අතර, බැංකුව විසින් සෑහීමට පත්වන පරිදි අන්‍යාකාරයකින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ සම්බන්ධයෙන් වූ වගකීම කාඩ්පත් හිමියා විසින් දරනු ලැබිය යුතුය.

(m) විශේෂ ප්‍රවර්ධන යටතේ කාඩ්පත් හිමියා වෙත පිරිනමා ඇති Rewards ලකුණු, එම ප්‍රවර්ධන නීතිරීති සහ කොන්දේසිවල දක්වා ඇති ආකාරයට, ප්‍රවර්ධනය අවසානයේ කාඩ්පත් හිමියා වෙත නිකුත් කරනු ඇත.

(n) මෙකී නීතිරීති වල දක්වා ඇති කරුණු නොතකා, කාඩ්පත් ගිණුම්, සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහනට සහභාගිවීමේ සුදුසුකම් ලැබීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ පරම අභිමතය සහ කිසිදු හේතුවක් නොදක්වා, ඕනෑම කාඩ්පත් ගිණුමක් සහ/හෝ කාඩ්පත් හිමියෙකු සෙලාන් කාඩ්පත් Rewards වැඩසටහනට සහභාගිවීමට නුසුදුසු බවට පමුණුවීමේ හිමිකම සෙලාන් බැංකුව සතු වේ.

(o) ආපසු ලබාදෙන ලද සෙලාන් කාඩ්පත් Rewards ලකුණු එක් වරක් භාවිත කළ පසු, ආපසු ලබාගත නොහැකි වේ.

## 19. වාරික සහ ශේෂ පැවරීමේ සැලසුම්

සෙලාන් පහසු ගෙවීමේ සැලසුම් වැඩසටහන් වශයෙන් නම් කර ඇති සෙලාන් ශේෂ පැවරුම් වාරික සැලසුම් (SBTIP), Flexi Plan, Relax Plan, Express Cash සහ 0% වාරික සැලසුම්, ආදිය, එකී වැඩසටහන් සඳහා කාඩ්පත් හිමියා සම්බන්ධ වන අවස්ථාවේ දී බැංකුවේ වෙබ් අඩවියෙහි පළ කිරීම හෝ අදාළ අයදුම්පතෙහි (වේ නම්) දැක්වීම මගින් නිකුත් කරනු ලබන, එකී වැඩසටහන් සඳහා ම වන නීතිරීති සහ කොන්දේසි මාලාව මගින් පාලනය වේ. අදාළ වාරික සැලසුම ලබාගන්නා අවස්ථාවේ දී, එකී නීතිරීති සහ කොන්දේසි හොඳින් කියවා, තේරුම්ගෙන, පිළිගත යුතු වේ.

**20. රක්ෂණ පැකේජයන්**

20.1 කාඩ්පත් හිමියා විසින් ආපසු පැමිණීමේ ගුවන් ටිකට්පතේ සමස්ථ වටිනාකම ම කාඩ්පත් ගිණුමට (විශේෂිතව දක්වනු ඇති කාලසීමාවක් සඳහා) හෝ කාඩ්පත් හිමියා විසින් ලබාගෙන ඇති කාඩ්පතෙහි සැලසුම් වර්ගයට අනුව වන අය කිරීමක් අනුව, පවරනු ලබයි නම්, බැංකුව විසින් ලබාගත් රක්ෂණ ඔප්පුවේ නීතිරීති සහ කොන්දේසි ප්‍රකාර ව අදාළ අවස්ථාවල දී ගමනාගමන රක්ෂණය සඳහා කාඩ්පත් හිමියා ආවරණය කරනු ලැබිය යුතුය. මෙම රක්ෂණ ඔප්පුව යටතේ වූ හිමිකම් ගෙවීම සඳහා රක්ෂණ සමාගම හෝ සංස්ථාව පරම වශයෙන් වගකිව යුතු බවත් හිමිකම් වන්දි මුදල් සකස් කිරීම සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ වෙනත් කිසිම ක්‍රමයකින් බැංකුව වගකීමට බැඳී නොමැති බවත් කාඩ්පත් හිමියා විශේෂයෙන්ම පිළිගෙන සිටියි. බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන්) වෙත පූර්ව දැනුම්දීමක් සහිතව මෙම රක්ෂණ ඔප්පුව සහ එහි ප්‍රතිලාභ ඉවත්කරගනු ලැබිය හැකිය.

20.2 බැංකුව විසින් ලබාගැනීමේ පහසුකම් සලස්වා ඇති සියලු රක්ෂණ ප්‍රතිලාභ අදාළ රක්ෂණ සමාගම හෝ සංස්ථාව විසින් අදාළ කරගනු ලබන නීතිරීති සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

20.3 ගෙවීම් නොකිරීම, යම් පොරොන්දුවක් කඩකිරීම හෝ රක්ෂණ සමාගමේ/සංස්ථාවේ සේවාවන් හා සම්බන්ධයෙන් වූ යම් පැහැර හැරීමක් හේතුවෙන් හෝ එහි ප්‍රතිවිපාක ලෙස ඇතිවන ඕනෑම ආකාරයේ හිමිකම්පෑමක් සඳහා බැංකුව කාඩ්පත් හිමියා වෙත වගකියනු නොලැබේ.

20.4 අවස්ථාවෝචිතව, යම් හේතුවක් නිසා කාඩ්පත වසා දැමීම සහ බැංකුව විසින් කාඩ්පත් ගිණුම අවලංගු කර හෝ අවසන් කර හෝ අවහිර කර හෝ ඇති අවස්ථාවක දී කාඩ්පත් මත වන රක්ෂණ ආවරණයන් අවසන් වන්නේය.

**21. කාඩ්පත් හිමියන්ගේ තොරතුරු එකතු කිරීම, සැකසුම හා හුවමාරු කරගැනීම එකතු කිරීම**

21.1 **එකතු කිරීම**

සෙලාන් බැන්ක් පීඑල්සී සහ සෙලාන් බැන්ක් පීඑල්සී හි බලයලත් වෙනත් තුන්වැනි පාර්ශ්වයෙන් නියෝජිතායතන විසින් කාඩ්පත් හිමියන්ගේ තොරතුරු (කාඩ්පත් හිමියා, කාඩ්පත් හිමියාගේගනුදෙනු, කාඩ්පත් හිමියා විසින් සෙලාන් බැංකුවේ සැලසුම් හා සේවාවන් භාවිතය සහ සෙලාන් බැන්ක් පීඑල්සී සමග වන කාඩ්පත් හිමියාගේ සම්බන්ධය පිළිබඳ අදාළ තොරතුරු ද ඇතුළත්ව) එකතු කිරීම, භාවිත කිරීම හා හුවමාරු කරගැනීම සිදුකළ හැක. කාඩ්පත් හිමියන්ගේ තොරතුරු කාඩ්පත් හිමියන් (හෝ කාඩ්පත් හිමියා වෙනුවට ක්‍රියා කරන පුද්ගලයකු) වෙතින් ඉල්ලා සිටිය හැකි අතර, නැතහොත් වෙනත් මූලාශ්‍රයකින් (පොදුවේ ලබාගත හැකි තොරතුරු ද ඇතුළත්ව) සෙලාන් බැන්ක් පීඑල්සී හෝ සෙලාන් බැන්ක් පීඑල්සී හි වෙනත් සාමාජිකයෙකු වෙත ලබාගත හැකිව ඇති වෙනත් තොරතුරු සමඟ උත්පාදිත හෝ සම්බන්ධිතව, සෙලාන් බැන්ක් පීඑල්සී විසින් හෝ වෙනුවෙන් හෝ, සෙලාන් බැන්ක් පීඑල්සී හි සාමාජිකයන් විසින් ද එකතුකර ගත හැකිය.

## 21.2 සැකසුම

සෙලාන් බැන්ක් පීඑල්සී විසින් පහත දැක්වෙන අරමුණු සඳහා කාඩ්පත් හිමියන්ගේ තොරතුරු සැකසීම, පැවරීම, හා හෙළිදරව් කිරීම සිදුකරනු ඇත. (a) කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටින ලද හෝ අවසර දෙන ලද යම් ගනුදෙනුවක් සඳහා සේවාවන් සැපයීම (b) අනුකූලව ක්‍රියා කිරීමේ බැඳීම් ඉටුකිරීම (c) මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදුකිරීම (d) කාඩ්පත් හිමියා වෙතින් අයවිය යුතු යම් මුදලක් එකතුකර ගැනීම (e) ණය පරීක්ෂා සිදු කිරීම හා ණය තොරතුරු ලබාගැනීම හෝ සැපයීම (f) සෙලාන් බැන්ක් පීඑල්සී හි අයිතීන් බලාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම (g) සෙලාන් බැන්ක් පීඑල්සී හි අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සඳහා (ණය හා අවදානම් කළමනාකරණය, පද්ධති හෝ සැලසුම් සංවර්ධනය හා සැලසුම්කරණය, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද ඇතුළත්ව, ඊට සීමා නොවී) (h) කාඩ්පත් හිමියා සමග සෙලාන් බැන්ක් පීඑල්සී හි සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම (මූල්‍ය සේවා හෝ ඊට අදාළ සැලසුම් කාඩ්පත් හිමියා වෙත අලෙවිය හෝ ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳපොළ සමීක්ෂණ ද ඇතුළත්ව) ("අරමුණු").

## 21.3 කාඩ්පත් හිමියාගේ තොරතුරු බෙදා-හදා ගැනීම

සෙලාන් බැන්ක් පීඑල්සී විසින් (අරමුණ සඳහා අවශ්‍ය වන පරිදි හා සුදුසු පරිදි) පහත ලැබුම්කරුවන් (අරමුණු සඳහා කාඩ්පත් හිමියන්ගේ තොරතුරු සැකසීම, පැවරීම හා හෙළිදරව් කිරීම ඔවුන් විසින් ද සිදු කළ හැකිය) වෙත කාඩ්පත් හිමියන්ගේ තොරතුරු පැවරීම හෝ හෙළිදරව් කිරීම කළ හැකි බවට සේවාවන් භාවිත කිරීම මගින් කාඩ්පත් හිමියා එකඟ වෙයිඃ

යම් උප-කොන්ත්‍රාත්කරුවෙකු, නියෝජිතයෙකු, සේවා සපයන්නෙකු, හෝ සම්බන්ධිත ආයතනයක් (ඔවුන්ගේ සේවකයින්, අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් ඇතුළත්ව);

සේවාවන් හි දී හෝ සේවාවන් සම්බන්ධයෙන් අයිතියක් ලබාගන්නා හෝ අවදානමක් භාරගන්නා යම් පාර්ශ්වයක්;

ණය තොරතුරු ලබාගැනීම හා සපයාදීම සඳහා වෙනත් මූල්‍ය ආයතන, ණයවර යොමු නියෝජිත ආයතන, හෝ ණය තොරතුරු කාර්යාංශ, විගණකවරුන්/බදු උපදේශකවරුන්;

කාඩ්පත් හිමියා වෙත වත්කම් කළමනාකරණ සේවාවන් සපයන යම් තෙවන පාර්ශ්වයක අරමුදල් කළමනාකරුවෙකු;

සෙලාන් බැන්ක් පීඑල්සී විසින් හඳුන්වාදීම් හෝ තොරතුරු සපයන යම් හඳුන්වාදීමේ අතරමැදියෙකු;

යම් සෙලාන් බැන්ක් පීඑල්සී ව්‍යාපාර පැවරීම්, අතහැරීම්, ඒකාබද්ධවීම් හෝ අත්පත් කරගැනීම් හා සම්බන්ධයෙන්;

සේවාවන් සපයනු ලබන බලප්‍රදේශයන් හා සමානව යම් මට්ටමක ආරක්ෂාවක් සපයන දත්ත ආරක්ෂණ නීති නොමැති බලප්‍රදේශයන් හි පිහිටා තිබුණ ද, ඒවා ද ඇතුළත්ව.

## 22. කාඩ්පත් හිමියාගේ බැඳීම්

(i) සෙලාන් බැන්ක් පීඑල්සී වෙත සපයා ඇති කාඩ්පත් හිමියන්ගේ තොරතුරුවල යම් වෙනසක් සිදුව ඇත්නම් කලින් කලට, කවර අවස්ථාවක දී වුවද දින 30ක් තුළ වහාම සෙලාන් බැන්ක් පීඑල්සී වෙත ලිඛිත ව දැනුම් දීමට ද සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලැබෙන යම් ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ද කාඩ්පත් හිමියා එකඟ වෙයි. සෑම සම්බන්ධිත තැනැත්තෙකු /තැනැත්තන්, ඔවුන් විසින් සෙලාන් බැන්ක් පීඑල්සී වෙත තොරතුරු (පෞද්ගලික තොරතුරු හෝ බදු තොරතුරු ඇතුළත් ව) සපයා ඇති යම් තැනැත්තෙකු වෙත මෙම නීතිරීතිවල දක්වා ඇති ආකාරයට ඔවුන්ගේ තොරතුරු සැකසුම, හෙළිදරව් කිරීම හා පැවරීම සම්බන්ධව දන්වා ඇති බව හා එකඟ වී ඇති බව කාඩ්පත් හිමියා තහවුරු කරයි. සිය පෞද්ගලික දත්තවලට ප්‍රවේශවීමට සහ ඒවා නිවැරදි කිරීමට එම සම්බන්ධිත තැනැත්තන් / වෙනත් යම් තැනැත්තන්ට අයිතිය ඇති බවට කාඩ්පත් හිමියා ඔවුන් වෙත උපදෙස් දිය යුතුය.

යම් අවස්ථාවක,

සෙලාන් බැන්ක් පීඑල්සී විසින් සාධාරණව ඉල්ලා සිටින කාඩ්පත් හිමියන්ගේ තොරතුරු සපයා දීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, හෝ අරමුණු සඳහා තොරතුරු සැකසුම, පැවරීම හෝ හෙළිදරව් කිරීමට සෙලාන් බැන්ක් පීඑල්සී විසින් අවශ්‍ය කෙරෙන යම් කැමැත්ත පළකිරීමක් කාඩ්පත් හිමියා විසින් රඳවා ගතහොත් හෝ ඉවත් කරගතහොත්, හෝ මූල්‍ය අපරාධයක් සිදු කිරීමේ හැකියාව

පිළිබඳව සෙලාන් බැන්ක් පීඑල්සී හට සැක පහළ වන අවස්ථාවක දී, හෝ  කාඩ්පත් හිමියා වෙතින් සෙලාන් බැන්ක් පීඑල්සී වෙත මූල්‍ය අපරාධයක් සිදු කිරීමේ අවදානමක් ඇතිවන අවස්ථාවක දී,

සෙලාන් බැන්ක් පීඑල්සී විසින්,

කාඩ්පත් හිමියා වෙත නව සේවාවන් හෝ සේවාවන් සියල්ල හෝ ඉන් කොටසක් අඛණ්ඩව සැපයීමට නොහැකි විය හැකි අතර, කාඩ්පත් හිමියා සමග සිය ව්‍යාපාරික සබඳතා අවසන් කර දැමීමට අයිතිය රඳවා ගනියි; අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීමට සෙලාන් බැන්ක් පීඑල්සී හට අවශ්‍ය වන යම් පියවර ගැනීම සහ/හෝ;  කාඩ්පත් හිමියාගේ ගිණුම (ගිණුම්) අවහිර කිරීම, පැවරීම හෝ වසා දැමීම හෝ කළ හැකිය.

## 23. දත්ත ආරක්ෂාව

දේශීය බලප්‍රදේශයේ හෝ විදේශයක දත්ත ආරක්ෂක ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියාකරන අවස්ථාවක දී සෙලාන් බැන්ක් පීඑල්සී හි සියලුම සාමාජිකයින්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය හා තෙවන පාර්ශ්වයන් යටත් වන දැඩි රහස්‍ය හා ආරක්ෂක ආචාරධර්ම පද්ධතියක් මගින් පාරිභෝගික තොරතුරු ආරක්ෂා කෙරෙනු ඇත.

## 24. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්

මූල්‍ය අපරාධ නිරීක්ෂණය, විමර්ශනය හා වැළැක්වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇති නීති රෙගුලාසි සම්බාධක රෙජීමයන්, ජාත්‍යන්තර මඟපෙන්වුම්, සෙලාන් බැන්ක් පීඑල්සී හි අභ්‍යන්තර ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සහ/හෝ යම් බලධාරියෙකු වෙතින් ලැබෙන ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීමට සෙලාන් බැන්ක් පීඑල්සී සහ එහි සාමාජිකයන් (සිය තනි හා පූර්ණ අභිමතය යටතේ) සුදුසු යැයි සිතන යම් පියවර ගත යුතු වන අතර, එසේ පියවර ගනු ඇත. ("මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකරකම්").

ව්‍යාතිරේක ලෙස, සෙලාන් බැන්ක් පීඑල්සී විසින් මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ වන පොරොන්දුව මගින් යම් ගෙවීමක් සිදුකිරීම හෝ නිෂ්කාශනය, කාඩ්පත් හිමියන්ගේ උපදෙස් සැකසුම හෝ සේවාවන් සඳහා අයදුම් කිරීම හෝ සේවාවන් සියල්ල හෝ එයින් කොටසක් සැපයීම ප්‍රමාද වීම, අවහිර කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුවිය හැක.  නීතියෙන් අවසර ඇති ප්‍රමාණයට, මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ වන පොරොන්දුව සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ කිසියම් ආකාරයකින් කාඩ්පත් හිමියාට හෝ යම් තෙවන පාර්ශ්වයකට පැන නගින, විඳින්නට හෝ දරන්නට සිදුවන යම් අලාභයක් සඳහා කාඩ්පත් හිමියා හෝ යම් තෙවන පාර්ශ්වයක් විසින් හෝ සෙලාන් බැන්ක් පීඑල්සී වගකීමට ලක් නොවනු ඇත.

බැංකුවෙහි අදාළ නීති, රෙගුලාසි වලට අනුව සහ කලින් කලට පවත්නා බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුව නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතයෙන් කාඩ්පත් හිමියා විසින් අතථ්‍ය ව්‍යවහාර මුදල් (virtual currencies), ක්‍රිප්ටෝ ව්‍යවහාර මුදල් (crypto currencies), බිට්කොයින්ස් (bitcoins) ඇතුළුව නමුත් ඊට සීමා නොවී මිලදී ගැනීම, විකිණීම සහ/හෝ භාවිතය සහ/හෝ ෆොරෙක්ස් වෙළෙඳාම (forex trading), ප්‍රාග්ධන ගනුදෙනු සහ විදේශ මුදල් පැවරීම් සිදුකිරීම නොකළ යුතු වේ.

**25. මෙම ගිවිසුමෙහි බලපැවැත්ම**

25.1 මෙම ගිවිසුම අවසන් කිරීම නොතකා, මෙහි අඩංගු සියලු විධිවිධානයන්, සිදු කරන ලද ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් සහ මේ යටතේ කාඩ්පත් හිමියා සහ ඕනෑම අතිරේක/පරිපූරක කාඩ්පත් හිමියකු (හිමියන්) විසින් දරන ලද ඕනෑම/සියලු වගකීම් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සහ යම් අතිරේක/පරිපූරක කාඩ්පත් හිමියකු (හිමියන්)ට එරෙහිව අඛණ්ඩව, පූර්ණ වශයෙන් බලාත්මකව සහ බලපැවැත්වීමෙන් යුතු වනු ඇත.

25.2 මෙම නීතිරීති සහ කොන්දේසි එකිනෙකින් වෙන්ව සහ එකිනෙකට වෙනස්ව පවතින අතර, එකී නීතිරීති සහ කොන්දේසි අතරින් එකක් හෝ ඊට වැඩි ගණනක් ඕනෑම අවස්ථාවක දී අවලංගු, නීති විරෝධී හෝ බලාත්මක කළ නොහැකි වෙමින් හෝ වී ඇත්නම්, ඉතිරි විධිවිධානයන් සම්බන්ධයෙන් වන වලංගු භාවයට, නීත්‍යානුකූල භාවයට, හෝ බලාත්මක භාවයට එයින් කිසිදු ආකාරයක බලපෑමක් ඇති නොවේ.

**26. නීතිය සහ අධිකරණ බලය**

26.1 මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතිය ප්‍රකාරව පාලනය වන සහ ඒ අනුව සකසන ලද්දකි.

26.2 කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුම හෝ එහි විෂය කරුණු හෝ සැකැස්ම හෝ මගින් හෝ ඒ සම්බන්ධයෙන් පැන නැගෙන නමුත්, ඕනෑම ණය සහ/හෝ ඉල්ලීම් සහ/හෝ අයිතීන් සහ/හෝ නඩුකර සහ/හෝ නඩු කටයුතු සහ/හෝ කාරණා සහ/හෝ ගැටලු සහ/හෝ ඕනෑම ආකාරයක වගවීම් ද ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඕනෑම මතභේදයක් සහ/හෝ හිමිකම් පෑමක් සම්බන්ධයෙන්, සෙලාන් බැන්ක් පීඑල්සී හි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති: සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03 හි අධිකරණ බලප්‍රදේශය තුළ නිසි අධිකරණයක් විසින් විනිශ්චය කරනු සහ/හෝ තීරණය කරනු ඇත.

යම් අවස්ථාවක

- බැංකුව විසින් සාධාරණව ඉල්ලා සිටින පාරිභෝගික තොරතුරු සපයා දීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, හෝ
- අරමුණු සඳහා තොරතුරු සැකසුම, පැවරීම හෝ හෙළිදරව් කිරීමට බැංකුව විසින් අවශ්‍ය කෙරෙන යම් කැමැත්ත පළකිරීමක් කාඩ්පත් හිමියා විසින් රඳවා ගතහොත් හෝ ඉවත් කරගතහොත්, හෝ
- මූල්‍ය අපරාධයක් සිදු කිරීමේ හැකියාව පිළිබඳව බැංකුවට සැක පහළ වන අවස්ථාවක දී, හෝ කාඩ්පත් හිමියා වෙතින් බැංකුව වෙත මූල්‍ය අපරාධයක් සිදු කිරීමේ අවදානමක් ඇතිවන අවස්ථාවක දී,

බැංකුව විසින්,

a) කාඩ්පත් හිමියා වෙත නව සේවාවන් හෝ සේවාවන් සියල්ල හෝ ඉන් කොටසක් අඛණ්ඩව සැපයීමට නොහැකි විය හැකි අතර, කාඩ්පත් හිමියා සමග පවතින මෙම කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම අවසන් කර දැමීමට අයිතිය රඳවා ගනියි.

b) අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීමට අවශ්‍ය වන යම් පියවර ගැනීම; සහ/හෝ

c) ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම (ගිණුම්) අවහිර කිරීම, පැවරීම හෝ වසා දැමීම කළ හැකිය.

26.3 මූල්‍ය අපරාධ නිරීක්ෂණය, විමර්ශනය හා වැළැක්වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇති නීති රෙගුලාසි සම්බාධක රෙජීමයන්, ජාත්‍යන්තර මඟපෙන්වුම්, බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සහ/හෝ යම් බලධාරියෙකු වෙතින් ලැබෙන ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීමට බැංකුව සහ එහි සාමාජිකයන් විසින් (සිය තනි හා පූර්ණ අභිමතය යටතේ) සුදුසු යැයි සිතන යම් පියවර ගත යුතු වන අතර, එසේ පියවර ගනු ඇත. ("මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකරකම්").

26.4 එම පියවරවලට, (a) යම් උපදෙසක්, සන්නිවේදනයක්, මුදල් ඉපදවීමේ ඉල්ලීමක්, සේවාවන් සඳහා අයදුම් කිරීමක් හෝ කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් යවන ලද හෝ ලබන යම් ගෙවීමක් නිරීක්ෂණය, හසුකරගැනීම හා විමර්ශනය කිරීම (b) අරමුදල්වල මූලාශ්‍රය හෝ අරමුණු කරන ලද ලැබුම්කරුවන් පිළිබඳව විමර්ශනය කිරීම (c) කාඩ්පත් හිමියාගේ තොරතුරු, බැංකුව සතුව ඇති අනෙකුත් අදාළ තොරතුරු හා සම්බන්ධ කිරීම සහ/හෝ (d) ඇතැම් පුද්ගලයෙකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් ඔවුන් සම්බාධක රෙජීමයකට යටත් වන්නේ ද යන්න වැඩිදුර විමසීම් කිරීම හා කාඩ්පත් හිමියාගේ අනන්‍යතාව හා තත්ත්වය තහවුරු කරගැනීම ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.

## 27. බඳු අනුකූලතාව

27.1 අදාළ බැඳීම් පැන නගින සහ බැංකුව විසින් සපයන ගිණුම (ගිණුම්) හෝ සේවාවන් විවෘත කිරීමට අදාළව සියලුම බලප්‍රදේශයන් තුළ දී කාඩ්පත් හිමියාගේ බදු බැඳීම් (බදු ගෙවීම හෝ අදාළ සියලු බදු ගෙවීම සම්බන්ධයෙන් ඇති ලේඛන හෝ වෙනත් දෑ සම්පූර්ණ කිරීම සහ භාරදීම ද ඇතුළත්ව) වටහාගැනීම හා ඊට අනුකූලව ක්‍රියාකිරීම සඳහා කාඩ්පත් හිමියා සම්පූර්ණයෙන් වගකිව යුතු වන බව කාඩ්පත් හිමියා පිළිගනියි. කාඩ්පත් හිමියාගේ තත්ත්වයෙන් සම්බන්ධිත තැනැත්තෙකු වශයෙන් ක්‍රියා කරන සෑම සම්බන්ධිත තැනැත්තෙකුම (සිය පෞද්ගලික තත්ත්වයෙන් නොව) තමන් සම්බන්ධයෙන් එම පිළිගැනීම ම සිදුකරයි. සම්බන්ධිත තැනැත්තාගේ හෝ කාඩ්පත් හිමියාගේ වාසභූමිය, නේවාසික ස්ථානය, පුරවැසි භාවය හෝ සංස්ථාපිත කිරීම නොසලකා, සමහර රටවල දේශසීමාවෙන් බාහිර බලපෑම් සහිත බදු ව්‍යවස්ථාවන් පැවතිය හැක. බැංකුව විසින් බදු උපදේශනය සපයනු නොලැබේ. ස්වාධීන නීතිමය හා බදු උපදෙස් සපයා ගන්නා ලෙස කාඩ්පත් හිමියාට උපදෙස් දෙමු. ගිණුම විවෘත කිරීම හා භාවිත කිරීම සහ බැංකුව විසින් සපයනු ඇති සේවාවන් සම්බන්ධයෙන් විශේෂයෙන් අදාළ වන බැඳීම් ද ඇතුළත්ව කිසිදු බලප්‍රදේශයක පැන නගිනු ඇති කාඩ්පත් හිමියාගේ බදු බැඳීම් සම්බන්ධයෙන් බැංකුව වෙත වගකීමක් නොමැත.

## 28. විවිධ

28.1 මෙම නීතිරීතිවල සහ වෙනත් යම් සේවාවක, සැලසුමක, ව්‍යාපාරික සම්බන්ධතාවක, ගිණුමක, හෝ කාඩ්පත් හිමියා හා සෙලාන් බැන්ක් පීඑල්සී අතර ඇති ගිවිසුමක ඇති කිසිවක් අතර කිසියම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇතිවන අවස්ථාවක දී, මෙම නීතිරීති බලාත්මකව පවතිනු ඇත. කාඩ්පත් හිමියාගේ තොරතුරු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වෙතින් ලැබී ඇති දැනටමත් පවතින යම් කැමැත්ත පළකිරීමක්, බලය දීමක්, සෙලාන් බැන්ක් පීඑල්සී විසින් ඉල්ලා සිටි අයිතීන් අතහැරීමක් හා අවසර දීමක් අදාළ දේශ නීතිය මගින් අවසර ලැබෙන ප්‍රමාණයට පූර්ණ බලය සහ බලපැවැත්වීම සහිතව අඛණ්ඩව අදාළ වනු ඇත.

28.2 කිසියම් ආකාරයකින් යම් බලප්‍රදේශයක නීතිය යටතේ මෙම නීතිරීතිවල ඇති ප්‍රතිපාදන සියල්ලම හෝ ඉන් කොටසක් හෝ නීතිවිරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වුවහොත් එමගින් වෙනත් යම් බලප්‍රදේශයක එම ප්‍රතිපාදනවල හෝ එම බලප්‍රදේශයේ මෙම නීතිරීති වලින් ඉතිරියෙහි නීත්‍යානුකූල භාවයට, වලංගුතාවට හෝ බලාත්මක කළ හැකි බවට බලපෑමක් හෝ හානියක් සිදු නොවනු ඇත.

## 29. අවසන් කිරීමෙන් පසුව පැවැත්ම

කාඩ්පත් හිමියා විසින් මෙම කාඩ්පත් ගිවිසුම අවසන් කළ ද, සහ/හෝ කාඩ්පත සහ/හෝ කාඩ්පත් හිමියාගේ ගිණුම වසා දැමීම සිදු කළ ද, සෙලාන් බැන්ක් පීඑල්සී විසින් කාඩ්පත් ගිවිසුම අවසන් කළ ද හෝ සෙලාන් බැන්ක් පීඑල්සී හි නියෝජිතයන් (සේවක සේවකයින්, නිලධාරීන් හෝ අධ්‍යක්ෂවරුන්

ද ඇතුළුව) විසින් සලසන ලද කිසියම් සේවාවක් ලබාදීම අවසන් කළ ද, හෝ කාඩ්පත සහ/හෝ කාඩ්පත් හිමියාගේ ගිණුම වසා දැමීම සිදු කළ ද, එය නොතකා, මෙකී නීතිරීති අඛණ්ඩව අදාළ වනු ඇත.